වාර්ෂික වාර්තාව **2015**

නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව.

"යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ පුරෝගාමියෝ"

පටුන

	පිටුව
• සංස්ථාව සම්බන්ධව සැකෙවින්	01
• ආයතනික තොරතුරු	02
• ආයතනයේ ඉදිරිදැක්ම, ගමන්මග හා අරමුණු	03
• සභාපතිතුමාගේ පණිවුඩය	04-05
• අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය	06
• රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට අයත් ඉදිකිරිම් ව්‍යාපෘති, කාර්යාල සහ සංචාරක බංගලා පිහිටි ස්ථාන	07-08
• ආයතනික පාලනය	09-13
• මෙහෙයුම් හා මූල්‍ය කටයුතු සමාලෝචනය	14-20
• මානව සම්පත් සමාලෝචනය	21-22
• විගණන කමිටු වාර්තාව	23-24
• මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල වගකීම දැක්වෙන ප්‍රකාශනය	25
• දස අවුරුදු සාරාංශය	26
• විගණකාධිපති වාර්තාව	27-46
• විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය	47
• මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	48
• හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය	49
• මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	50
• ගිණුම්කරණ ප්‍රතිපත්ති	51-64
• ගිණුම් සටහන්	65-83
• ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රමිති අංක 11 යටතේ හෙළිදරව් කිරීම	84-86

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

1957 අංක 49 දරණ කර්මාන්ත සංයුක්ත මණ්ඩල පනතට අනුව මහා පරිමාණ සිවිල් ඉංජිනේරුමය කොන්ත්‍රාත්තු කටයුතු කිරීම සඳහා 1971 වර්ෂයේ දී රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පිහිටුවා තිබේ. සංස්ථාවේ එකම කොටස්කරු වශයෙන් කටයුතු කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයයි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පාලම්. මහා මාර්ග. ජලාශ. වාරිමාර්ග පද්ධති. ජල විදුලි බලාගාර. උමං හා ඇල මාර්ග. ජල සැපයීම් ව්‍යාපෘති, ගොඩනැගිලි හා කැලෑ එළි පෙහෙළි කිරීම හා ඉඩම් සංවර්ධනය කිරීම යන ඉංජිනේරුමය කාර්යයන්හී නිරතව සිටී.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පෙරසවී කොන්ක්‍රීට් නිෂ්පාදන අයිතම වල සිට පෙරසවි කොන්ක්‍රීට් පාලම් කඳම්හ(BEAMS), සම්ප්‍රේෂණ කුළුණු සහ දුම්රිය පාකඩ (Raliway Sleepers) දක්වා වන සියලුම කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනයේ පුරෝගාමී ආයතනයකි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව රටේ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයෙහි ක්‍රියාකාරීව සම්බන්ධ වෙමින් ජාතික ආර්ථිකයට සෘජුවම දායකත්වය ලබා දෙන අතර, මීට අමතරව රජයේ කිසිම ආධාරයක් නොමැතිව ඉංජිනේරුවන් හා අනෙකුත් තාක්ෂණික ශිල්පින් පුහුණු කිරීම තුලින් ද ඉදිකිරීම් ක්ෂේත්‍රයට හා පොදුවේ රටට මිල කළ නොහැකි සේවාවක් සපයමින් සිටී.

ආයතනික තොරතුරු

ආයතනයේ නම	:	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
ආයතනයේ නෛතික තත්ත්වය	:	රාජ්‍ය සංස්ථා
සංස්ථාපන පනත	:	1957 අංක:49 දරණ කාර්මික ආඥා පනත යටතේ
සංස්ථාපනය කරන ලද වර්ෂය	:	1971
ලියාපදිංචි කාර්යාලය	:	අංක:7, බොරුපන පාර, රත්මලාන. දූ.ක. 0112-607560
කොන්ක්‍රීට් අංගන	:	

i රත්මලාන කොන්ක්‍රීට් අංගනය,
අංක:7,බොරුපන පාර,රත්මලාන.
දූ.ක. 0112-632786

ii බෝපිටිය කොන්ක්‍රීට් අංගනය,පන්නල
දූ.ක. 037-2288415

iii චේරගංතොට කොන්ක්‍රීට් අංගනය,
මහියංගණය .
දූ.ක. 055-2257101

iv. මැදවච්චිය කොන්ක්‍රීට් අංගනය
යාපනය පාර, මැදවච්චිය.
දූ.ක. 025-3899916

v. පේරාදෙණිය විකුණුම් මධ්‍යස්ථානය.
දූ.ක. 081-2387056

විගණක:	:	විගණකාධිපති දෙපාර්තමේන්තුව
බැංකුකරුවෝ	:	ලංකා බැංකුව මහජන බැංකුව සම්පත් බැංකුව

ආයතනයේ ඉදිරි දැක්ම, ගමන් මග හා අරමුණු

ඉදිරි දැක්ම

"ජාතික ආර්ථිකයට වටිනාකම් එකතු කරන යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු හොඳම ආයතනය වීම."

ඉදිරි ගමන් මග

ජාතික යටිතල පහසුකම් සංවර්ධනය හා විවිධ ඉදිකිරීම් කටයුතු වලට සහභාගී වීම හා එම කටයුතු ඉහලම තත්ත්වයෙන් කර ගෙන යෑමත් මගින් රටේ ආර්ථික සංවර්ධනයට උදව් කිරීම හා සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් හා පෙරසවි / පෙරනිම් කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍ර වල වෙළඳ පොළ පෙර ගමන්කරු වීම.

අරමුණු

01. ලංකාව තුල හෝ විදේශයකදී ඕනෑම පාර්ශවයකට අයිති ගොඩනැගිලි සිවිල් ඉංජිනේරුමය කාර්යයන්, අනෙකුත් ඉංජිනේරුමය ව්‍යාපෘති හෝ අනෙකුත් ව්‍යාපාර තනිව හෝ අනෙකුත් දේශීය සමාගමක් සමග එක්ව හෝ වෙනත් විදේශීය සමාගමක් සමග එක්ව හෝ අනෙකුත් එවැනි ආයතනයක් පවරා ගැනීමෙන් හෝ කොටස් ලබා ගැනීමෙන් විමර්ශනය, ආයෝජනය, සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම.

02. ඉහත සඳහන් ව්‍යාපෘති කාර්යයන් ශ්‍රී ලංකාව තුල හෝ විදේශයකදී ක්‍රියාත්මක කිරීම හෝ අධික්ෂණය කිරීම සඳහා තනිව හෝ අනෙකුත් දේශීය හෝ විදේශීය සමාගමක් සමග එකතුව හෝ එවැනි සමාගමක් පවරා ගැනීමෙන් හෝ කොටස් අත්පත් කර ගැනීම තුලින් කටයුතු කිරීම

03. ඉහත සඳහන් කරුණු 01 හෝ 02 අවශ්‍ය කරන යාන්ත්‍රික හා විදුලිමය කාර්යයන් සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හෝ තැනීම් කිරීම.

04. ඉංජිනේරුමය කාර්යයන් සඳහා අවශ්‍ය කොන්ක්‍රීට්, වෙර ගැන්වූ හා පෙරසවි කොන්ක්‍රීට් දේශීයව හෝ විදේශීයව නිෂ්පාදනය හා අලෙවි කිරීම.

05. ඉංජිනේරුමය ව්‍යාපෘති සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය උකහා ගැනීම සහ ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර සහ අමු ද්‍රව්‍ය නිෂ්පාදනය, අලෙවි කිරීම, ආනයනය සහ අපනයනය කිරීම.

06. ඉහත සඳහන් අංක 1 2 3 හා 4 කාර්යයන් සඳහා අවශ්‍ය ඉදිකිරීමේ ද්‍රව්‍ය, ක්‍රම සහ උපයෝගි කරගන්නා තාක්ෂණය සම්බන්ධව පර්යේෂණ කිරීම.

07. ඉහත අංක 1 2 3 හා 4 සඳහා අවශ්‍ය වන කළමණාකාරිත්ව දැනුම, කුසලතාවය හා නවීන තාක්ෂණික දැනුම යනාදිය කළමණාකරුවන්ට/ ඉංජිනේරුවන්ට/ තාක්ෂණික නිලධාරීන්ට පුහුණු වීමේ අවස්ථා මගින් ලබාදීම.

08. ශක්තිමත් ස්වයං මූල්‍ය හැකියාවක් ඇති ආයතනයක් වශයෙන් පවත්වා ගැනීම.

09. 10 %අවම ලාභාන්තිකයක් පවත්වා ගනිමින් ලාභදායි සහ ජව්‍ය ආයතනයක් වීම.

10. 30 % පිරිවැටුම් වර්ධනයක් ලගා කර ගැනීම.

11. අවදානම හඳුනා ගැනීම හා ක්‍රමානුකූලව කළමණාකරණය කිරීම.

සභාපතිතුමාගේ පණිවුඩය.

2015-12-31 න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටක් වේ.

සාර්ව ආර්ථික විග්‍රහය.

ශ්‍රී ලංකා ආර්ථිකය 2015 වර්ෂයේදී 4.8% ක පූර්ණ වර්ධනයක් වාර්තා කළ අතර එය 2014 වර්ෂයේදී 4.9% විය. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික අපනයන වෙළඳ පොළ සඳහා වූ ඉල්ලුම වර්ධනය වීම මන්දගාමී වීම අපනයන අංශයේ වර්ධනයට අහිතකර අන්දමින් බලපාන ලදි. එමෙන්ම ඇමරිකානු එක්සත් ජනපදය ආර්ථිකය සවිමත් වීම තුලින් කෙටී කාලීනව ප්‍රාග්ධනය රටින් බැහැරට ගලා යෑමත් සිදුවිය. ජාත්‍යාන්තර හාණ්ඩ මිල ගණන් පහළ මට්ටමක පැවතීම නිසා මෙම අහිතකර සිද්ධීන් හා බලපෑම හැකිතාක් දුරට සමනය කර ගැනීමට හැකි විය. කෙසේ නමුත් ආදයම්, විශේෂයෙන් රාජ්‍ය අංශ සේවකයන්ගේ, වැඩිවීම තුලින් දේශීය පරිභෝජනය යථා තත්ත්වයට පත්විය. කෘෂිකාර්මික සහ සේවා අංශ පිලිවෙලින් 5.5% සහ 5.3% බැගින් වර්ධනය වීමත් සිදුවිය. ඉදිකිරීම් අංශයේ (-0.9%) සහ පතල් හා කැණීම් අංශයේ (-0.9%) සිදු වූ සුළු පසු බැසීම් හැරුණු විට දළ දේශීය නිෂ්පාදනයේ 26.2% වන කර්මාන්ත අංශය 3% කින් වර්ධනය විය. ඒ සඳහා නිෂ්පාදන කටයුතු වල සිදු වූ වර්ධනය (4.7%) ප්‍රධාන ලෙස උපකාරී විය. මේ අතර පහළ මට්ටමක පැවති ඉන්ධන මිල ගණන් සහ සංචාරක ක්ෂේත්‍රයේ පැවති අඛන්ඩ ධණාත්මක රටාවන් තුලින් සැලකිය යුතු වාසියක් අත්පත් කර ගත් නමුත් විදේශීය ශ්‍රමික ප්‍රේෂණ සහ ප්‍රාග්ධන ගලායෑම් ඇතුලු ශුද්ධ විදේශීය විනිමය ලැබීම් හි සිදු වූ පහළ යෑම් ගෙවුම් ශේෂය තුල සමස්ථ හිඟයක් නිර්මාණය කරන ලදි.

ඉදිකිරීම් කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) සහ ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීමේ සංගමය ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්තයේ බලය ලත් මෙන්ම එය නියෝජනය කරන ආයතන වේ. බොහෝ රජයේ ආයතන මෙම පෞද්ගලික ඉදිකිරීමේ සමාගම්ද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇත. එමෙන්ම ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවෝ මෙන්ම ජාත්‍යන්තර ඉදිකිරීම් ආයතනද ඉදිකිරීමේ කාර්යයේ නියැලී සිටී.

රජය විසින් 2015 වර්ෂයේදී මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති එම ව්‍යාපෘතින්හි පැවති ගැටලු නිරාකරණය තෙක් අත්හිටුවීමට කටයුතු කරණු ලැබීය. එම නිසා 2015 වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු සඳහා සුභදායි තත්ත්වයන් නොපැවතිණි. 2015 වර්ෂයේදී ඉදිකිරීමේ අංශය සෘණ 0.9% වර්ධනයක් පෙන්නුම් කරන ලදි. විශේෂඥයින් සහ කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකල වැඩ සඳහා ගෙවීම් ලබාගැනීම අපහසු වීම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටලුවක් විය. කෙසේ නමුත් ඉදිකිරීම් කර්මාන්තය වර්තමානයේ මුහුණ පා ඇති අහිතකර තත්ත්වය නිරාකරණය වී ඉදිරියේදී ඉදිකිරීම් කර්මාන්තය පෙර තිබූ ජවය නැවත අත්පත් කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ කාර්යය සාධනය

2015 වර්ෂයේ සංස්ථාව විසින් රුපියල් මිලියන 2,429 පිරිවැටුමක් වාර්තාකර ඇති අතර, එය පෙර වර්ෂයේදී රු. මිලියන 3,466 ක් විය. ප්‍රමාණවත් තරම් ව්‍යාපෘති නොමැති වීම නිසා පිරිවැටුම පහළ ගොස් ඇත. සංස්ථාව බදු පෙර ලාභය ලෙස 2015 වර්ෂයේ දී රුපියල් මිලියන 50.3 උපයාගෙන ඇත. මෙය පෙර වර්ෂයේ බදු පෙර ලාභය වන රුපියල් මිලියන 112.4 ට සාපේක්ෂව සැලකිය යුතු පහළ වැටීමකි.

ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය හා අනෙකුත් මෙහෙයුම් පිරිවැය වැඩිවීම නිසා සංස්ථාවේ මෙහෙයුම් පිරිවැය ඉහළ ගොස් ඇත. එහෙත් ඊට සාපේක්ෂව සංස්ථාවේ ලාභ අන්තික වැඩිකල නොහැක. මන්දයත් කර්මාන්තය තුල තරගකාරිව රැඳී සිටිය යුතු බැවින්, සංස්ථාවට අවම ලාභ අන්තික පවත්වා ගැනීමට සිදු වේ. විශේෂයෙන් පුද්ගලික අංශයේ මෙහෙයුම් පිරිවැය අඩුනිසා ඔවුන් ආකර්ශණීය මිල ගණන් ඉදිරිපත් කරුණු ලබයි. මෙය සංස්ථාව මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක්ව පවති.

රාජ්‍ය ආයතන සතුව ප්‍රමාණවත් මුදල් නොමැති වීම නිසා ව්‍යාපෘති සඳහා අයවිය යුතු ණය අයකර ගැනීම දුෂ්කර වී ඇත. එම නිසා සංස්ථාවේ ලැබිය යුතු ණය ශේෂයද ඉතා විශාල ලෙස ඉහළ ගොස් ඇත. ලැබිය යුතු මුදල් නියමිත දින වලදී නොලැබෙන විට ව්‍යාපෘති සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා සංස්ථාවට බැංකු ණය හා බැංකු අයිරා පහසුකම් වලට යොමු වීමට සිදු වේ. ණය පිරිවැය වැඩිවීම සංස්ථාවේ ලාභදායීත්වයට අහිතකර ලෙස බලපාන අතර, කාරක ප්‍රාග්ධන ගැටළුද වර්ධනය වේ.

<u>සංස්ථාව මුහුණ දෙන අභියෝග.</u>

රජය මගින් මුදල් ප්‍රතිපාදනය කරන ව්‍යාපෘති හෝ විදේශයන් මගින් මුදල් ප්‍රතිපාදනය කරන ව්‍යාපෘති ප්‍රමාණවත් තරම් නොමැති වීම නිසා සංස්ථාවේ පැවැත්මට අවශ්‍ය තරම් ව්‍යාපෘති ලබාගැනීමේ දුෂ්කරතාවයක් පවති. ආසියානු සංවර්ධන බැංකුවෙන් මුදල් ප්‍රතිපාදනය කරන ව්‍යාපෘති සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා නොදීමද සංස්ථාවේ වර්ධනය අඩාල කිරීමට හේතු වී ඇත.

මහා භාණ්ඩාගාරය සහ අනෙකුත් ගනුදෙනුකරුවන් විසින් ව්‍යාපෘති සඳහා මුදල් වෙන්කිරීම සහ මුදල් නිදහස් කිරීම අවම මට්ටමක පවතී. එම නිසා මුදල් නොලැබීයාම හේතුවෙන් සංස්ථාවට ද්‍රවශීලතා ගැටළුවලට මුහුණ දීමට සිදුවේ. මේ තත්ත්වය මත ආයතනයට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට අධික පිරිවැයන් යටතේ බැංකු ණය පහසුකම් ලබාගැනීමට සිදුවේ. එමෙන්ම ගණදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ණය ප්‍රමාද වීම නිසා නිරන්තරයෙන් වැඩ අත්හිටුවීමේ තත්ත්වයන් උද්ගත වේ.

එමෙන්ම පෞද්ගලික අංශයේ තරගකරුවන් විසින් ඇතැම් විට ඉංජිනේරු ඇස්තමේන්තු වලටත් අඩුවෙන් ලංසු ඉදිරිපත් කිරීම නිසා රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් නීතිගත සංස්ථාව වැනි රාජ්‍ය ආයතන වලට දැඩි තරගයකට මුහුණ දීමට සිදුව තිබේ.

<u>සාරාංශය.</u>

අප ආයතනයේ උන්නතිය උදෙසා කරනු ලබන මග පෙන්වීම හා උපදේශයන් වෙනුවෙන් නිවාස සහ ඉදිකිරීම් ගරු අමාත්‍යතුමාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත් එහි ලේකම්තුමා ඇතුළු අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ටත් ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි.

එසේම මාගේ අධ්‍යක්ෂ මණ්ඩලය කරන්නාවූ ඉතා විශාල දායකත්වය වෙනුවෙන්ද සාමාන්‍යාධිකාරිතුමා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහ ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය සහ අනෙකුත් සියළු තරාතිරම් වල සේවකයින් සංස්ථා අරමුණු ඉටුකර ගැනීම සඳහා කරන ලද කැපවීම වෙනුවෙන් ස්තුති කරන්නට කැමැත්තෙමි.

එසේම මා මේ අවස්ථාවේදී අපගේ වටිනා සේවාදායකයන් වන විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය. මාර්ග සංවර්ධන අධිකාරිය, වාරි මාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, සියළු පළාත් මාර්ග සංවර්ධන අධිකාරීන්, ලංකා විදුලි බල මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුවට අප කෙරෙහි දැක්වූ විශ්වාසය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි. එසේම ඉදිරියේදීද ඉතා කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දෙමින් අප කෙරෙහි දැක්වූ විශ්වාසය සහ ශක්තිය පවත්වා ගැනීමට බලාපොරොත්තු වෙමි.



වමින්ද එදිරිවික්‍රම
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය.

අධ්‍යක්ෂ මණ්ඩලය

01. චමින්ද එදිරිවික්‍රම මහතා	-	සභාපති
02. මර්වින් එන්. ද සිල්වා මහතා	-	උප සභාපති
03. පී. ඒ. අජිත් ප්‍රියන්ත මහතා	-	භාණ්ඩාගාර නියෝජිත
04. එස්. ඒ. ඩී. පී. ගුණවර්ධන මහතා	-	අධ්‍යක්ෂක
05. ඉංජි. වයි. එම්. අයි. බණ්ඩාර මහතා	-	අධ්‍යක්ෂක
06. නන්දන මල්කුමාර මහතා	-	අධ්‍යක්ෂක
07. සඳමාලි චන්ද්‍රසේකර මිය	-	අධ්‍යක්ෂිකා

<u>ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය</u>

01. ඉංජි. එම්.ඩී.එස්. විජයබණ්ඩාර මහතා	-	සාමාන්‍යාධිකාරී
02. ඉංජි. ඩී.එස්.ඩී.ඩී.සී.රාජසිංහ මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සං.හා.සැ)
03. ඉංජි එස්.එම්.එස්. ශකුර් මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉදිකිරීම්)
04. ඉංජි. වී. එල්. වීරතුංග මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(යාන්ත්‍රික)
05. ඉංජි. එච්. දමයන්ති මහත්මිය	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(ප්‍රගති සමාලෝචන)
06. ඩබ්ලිව්. ඒ. එන්. ආසිරි ප්‍රනාන්දු මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
07. කේ.ඒ.පී.වික්‍රමසිංහ මහතා	-	ජ්‍යෙෂ්ඨ කළමණාකාර(මානව සම්පත් හා පරිපාලන)
08. ආර්.ඒ.කේ. නිශාන්ත මහතා	-	ප්‍රධාන අභ්‍යන්තර විගණක
09. කේ.ඩබ්ලිව්.වී.එම්.බී.විජේසුන්දර මහතා	-	සැපයුම් කළමණාකරු
10. ඉංජි ඩබ්.ඒ.ඩී.ආර්.ශාන්ත කුමාර මහතා	-	ප්‍රධාන ඉංජිනේරු - 1
11. ඉංජි කේ.ඒ.යූ.රන්ජන් මහතා	-	ප්‍රධාන ඉංජිනේරු - 2
12. ඉංජි ඩී. ඒ. පී. දමයන්ති මහත්මිය	-	ප්‍රධාන ඉංජිනේරු - 3
13. ඉංජි අයි. වී.සී.යූ. කුමාර මහතා	-	ප්‍රධාන ඉංජිනේරු - 4
14. ඉංජි පී.එස්.ආර්.පෙරේරා මහතා	-	ප්‍රධාන ඉංජිනේරු (විදුලි)
15. ඉංජි ඒ.කේ.පී. වන්දන මහතා	-	වැඩ කළමණාකාර (කොන්ක්‍රීට් අංගනය)
16. යූ. කේ. එන්. නන්දලාල් මහතා	-	ප්‍රධාන ආරක්ෂක නිලධාරී

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට අයත් ඉදිකිරීම් ව්‍යාපෘති, කාර්යාල සහ සංචාරක බංගලා පිහිටි ස්ථාන.



873- උලපනේ පාලම.
979-982 කැගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග කාපට කිරීමේ ව්‍යාපෘතිය.
983-986 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මාර්ග කාපට කිරීමේ ව්‍යාපෘතිය පොළොන්නරුව පාර.
994- පාලම් ඉදිකිරීම් මොරගහකන්ද - වැල්ලවල පාර (කළු ගග වම්පස ඉවුරු සංවර්ධනය).
996 – සැලසුම් කාර්යාලය ii පියවර1-කලාපය 1 ඉංජිනේරු පීඨය -පේරාදෙණිය
997- අම්පාර උසස් අධ්‍යාපන ආයතනයේ නව ඉදිකිරීම්.
998- අංක 84. තලගල පාර කොට්ටාවෙහි පාලම නැවත ඉදිකිරීම්.
1009- සහස්ත්‍රපුර සහ සිංහපුර නිවාස සංකීර්ණය අදියර ii කැගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග කාපට කිරීමේ ව්‍යාපෘතිය.
1011- පලුගම බොරලන්ද හපුතලේ පාර පාලම් වැඩබිම්.
1012-ගල්ඔය පාලම වැඩබිම සම්බන්ධ සල්ගස්හන්දිය ඇල මාර්ගය
1070- දුම්රිය හරස්මග ඉදිකිරීම පලෙයි කොඩිකාමන්.
1071- සෙවනගල ඇලමාර්ගය
1081- රත්පොතුණුගම නිවාස සංකීර්ණයේ මලදුව්‍ය ප්‍රවාහනය බැහැර කිරීමේ මාර්ග පද්ධතිය ඉදිකිරීම.
1083- යෝජිත කිරිබත්ගොඩ බස් නැවතුම් අසල ඇල මාර්ගය හරහා පාලම ඉදිකිරීම.

1084-කොලමුන ඔය පාලම හුන්ගම කෝන්ගම පාර.
1088- සතිපොළ ඉදිකිරීම ව්‍යාපෘතිය කරමැටිය.
1089- සතිපොළ ඉදිකිරීම ව්‍යාපෘතිය බණ්ඩාරවත්ත.
1090- සතිපොළ ඉදිකිරීම ව්‍යාපෘතිය වාඩිගල.
1091- සතිපොළ ඉදිකිරීම ව්‍යාපෘතිය පත්තේගමුව.
1093-යෝජිත පාලම පළල් කිරීම බිඳුමැන්ඩල් පාර.
1094 –රත්කිද ප්‍රධාන ඇල මාර්ගය ඉවුර සංවර්ධනය.
1095- තලේමන්නාරම ජැටිය ඉදිකිරීම.
1096- බස් නැවතුම් පොළ ඉදිකිරීම දුනුගම් වෙහෙර.
1097- බස් නැවතුම් පොළ ඉදිකිරීම වලස්මුල්ල.
1098- පුනුරුත්ථාපනය කිරීම මීගමුව ජාතික රෝහල.
1100- 1104 කොළඹ නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම.
1106- දෙහිවල නිල්ඩා මහල් නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම.
1107- දුනාව සමෘද්ධි ශක්ති නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම.
1108 - මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතියේ ලග්ගල රෝහල ඉදිකිරීම.
1111 - පුනුරුත්ථාපනය මැදිරිය ඇතුලු නා ඉතිරි වැඩ ඉදිකිරීම් බණ්ඩාරපුර පෝෂක ප්‍රදේශ පොදු වැඩ.
1113 - නැවත ඉදිකිරීම් පාලම් අංක 1/1 මඩකලපුව - තිරුක්කොන්ඩියාදිමඩු - ත්‍රිකුණාමලය.

මොරගහකන්ද - වැල්ලවල පාලම

සෙවනගල ඇලමාර්ගය



දෙහිවල සත්වෝද්‍යාන මාර්ග අංක 5

බස් නැවතුම් පොල ලුනුගම්වෙහෙර.

කාක්කපල්ලිය මාතෘ සායන

ගාලු පාර විදුලි සංඥා පද්ධතිය
ආර්. ඒ. ඩී. මැල් මාවත

බස් නැවතුම් පොල වලස්මුල්ල.

තලෙයිමන්නාරම පාර.

ආයතනික පාලනය.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාවේ අරමුණු තීරණය කිරීමත් එකී අරමුණු ලඟා කර ගන්නා අයුරින් ආයතනයේ මෙහෙයුම් කර ගෙන යාමත් සහ කාර්යය සාධනය සොයා බැලීමත් ආයතනික පාලනය යන්නෙන් අදහස් කෙරේ. එමනිසා ව්‍යාපෘති අවදානම් ඵලදායි ලෙස හඳුනාගැනීමත් ඒවා පාලනය කිරීමත් සියලු ප්‍රමාණාත්මක ව්‍යාපාරික කළමනාකරණය කිරීමත් ආයතනික පාලනය තුලින් බලාපොරොත්තු වේ.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාව සම්පූර්ණයෙන් රාජ්‍ය හිමිකාරිත්වය යටතේ ඇති ආයතනයක් වන අතර, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය යටතේ ක්‍රියාත්මක වෙයි. අමාත්‍යාංශය හරහා අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුවම රජයට වගකීමට බැඳී සිටී. එම නිසා ආයතනය පාලනය කරනු ලබන්නේ සහ මෙහෙය වනු ලබන්නේ සංස්ථාවේ සහ එයට සම්බන්ධ වන පාර්ශවයන්ගේ යහපත පිණිස වන බවට සහ එය පාලනය වන නීතිරීති වලට අනුකූලව ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය බැඳී සිටී.

ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මුල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතු වේ. එම නිසා රාජ්‍ය ව්‍යවසාය පාර්ලිමේන්තුව පාලනයට යටත් වේ. අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධව තීරණ ගැනීමේ වගකීමට බැඳී සිටී. රාජ්‍ය සංස්ථාවල මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වගකීමට බැඳී සිටී. මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය, ආර්ථික කාර්යක්ෂමතාවය සහ ඵලදායීත්වය ඇතිකර ගැනීම සඳහා වන ඔවුනගේ වගකීම ඉටු කරන බව තහවුරු කර ගැනීමට අවශ්‍යය රෙගුලාසි නීතිරීති නියමයන් මග පෙන්වීම් සහ නියෝග චක්‍රලේඛ මගින් ලබාදෙනු ලබයි.

භාණ්ඩාගාර නියෝජිත වශයෙන් කටයුතු කරනු ලබන අධ්‍යක්ෂ හැර අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල පත්වීම් විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කරනු ලබයි. කොටස් හිමිකාරිත්වය දරණ මහා භාණ්ඩාගාරය විසින් එක් අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබයි.

සංස්ථාවේ ලැදියාවත් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ පුද්ගලික ලැදියාවන් අතරේ එකිනෙක ගැටෙන තත්ත්වයන් නොමැති අතර, සංස්ථාවේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන්නේ. ඉදිකිරීම් තුල වඩා හොඳ මූල්‍යමය සහ මෙහෙයුම් ශක්තියෙන් යුතු ආයතනයක් බවට පත්කිරීමටය. ආයතනික යහපාලනය උදෙසා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාව විසින් ගෙන ඇති පියවරයන් පහත දැක්වේ.

ආයතනික යහපාලනය

යහපාලන මූලධර්ම	පවත්වාගෙන යාමේ ක්‍රමවේදය
අධ්‍යක්ෂ මණ්ඩලය	
අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය	අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ වරයෙකුගෙන්ද, විධායක නොවන අධ්‍යක්ෂවරු පස් දෙනෙකුගෙන්ද සමන්විතය. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු පත්කරනු ලබන්නේ මහාභාණ්ඩාගාරය විසිනි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ අවශ්‍යතාවයට අනුව සහ මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය වන පරිදි ප්‍රමාණවත් මග පෙන්වීමක් කල හැකි විශේෂ හා විවිධ හැකියාවන්ගෙන් යුතු කණ්ඩායමකින් සමන් විතය.
ක්‍රමානුකූලව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.	විශේෂ අවස්ථාවන්හි පැවැත්විය යුතු රැස්වීම් වලට අමතරව සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ක්‍රමානුකූලව පවත්වනු ලැබේ.
අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගැනීමට අයත්වන විධිමත් කාරණා ලැයිස්තුවක් පවත්වා ගැනීම.	<u>අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වගකීමට බැඳේ</u> • රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයන් හැටියට සංස්ථාවේ සාර්ථක කාර්ය සාධනයක් සහතික කිරීම. • ප්‍රතිපත්ති, ක්‍රමවේදයන් සැකසීම සහ ඒවා සාර්ථකව ක්‍රියාත්මක කරනවාද යන්න අධීක්ෂණය කිරීම. • සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමණාකරන නිලධාරීන් පත්කිරීම, ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්ගේ කාර්යය සැලසුම් කිරීම සහ ආයතනයේ ව්‍යුහය අනුමත කිරීම. • ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන යාම සහතික කිරීම. • උසස් නෛතික ප්‍රමිතියක් පවත්වාගෙන යාම සහතික කිරීම මේ යටතේ භාණ්ඩාගාර චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ මගපෙන්වීම් පිළිපැදීම පිළිබඳව සලකා බැලේ • සභාපතිගේ සහ සාමාන්‍යාධිකාරිගේ පාලනයට යටත් නොවන ගෙවීම් වන වාර්ෂික ප්‍රසාද දීමනා, නිවාඩු පඩි ගෙවීම් යනාදිය අනුමත කිරීම. • දේපළ පිරියත සහ උපකරණ වල ප්‍රධාන ප්‍රාග්ධන ආයෝජන තීරණය කිරීම. • වාර්ෂික අයවැය සහ සංයුක්ත සැලැස්ම අනුමත කිරීම. • ප්‍රසිද්ධ කිරීම සඳහා වන වාර්ෂික ගිණුම් වාර්තා අනුමත කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙක් සංස්ථාවේ දැනට නොමැති අතර, එහි කාර්යයන් සභාපතිගේ ලේකම්වරිය ආවරණය කරනු ලබයි. සභාපතිගේ අනුමැතියට යටත්ව ඇය විසින් සියළු රැස්වීම් පැවැත්වීම පිළිබඳ දැන්වීම. රැස්වීම් වාර්තා රැස්වීම් දිනට පෙර බෙදාහැරීම යන කාර්යයන් සිදු කරනු ලබයි. රැස්වීම් වාර්තා අත්සන් කරනු ලබන සභාපතිගේ අධීක්ෂණය යටතේ ඇය විසින් රැස්වීම් වාර්තා සහ කටයුතු සටහන් කරනු ලබයි.
ස්වාධීනව තීරණ ගැනීම සහ වඩාත් සුදුසු ක්‍රම වේදය	කළමණාකරන මණ්ඩලය විසින් වටිනාකම් එකතු කරමින්ද, ස්වාධීන තීරණ ගනිමින්ද, රා.සං.හා.නි.නි. සංස්ථාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගිවේ. එමෙන්ම, බාහිර බලපෑම් වලින් සහ පාලනයන්ගෙන් තොරව ඔවුන්ගේ වගකීම් ඉටුකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි.
සංස්ථාවේ සහ මණ්ඩලයේ කාරනා සම්බන්ධයෙන් සාධාරණව කාලය සහ ශ්‍රමය වෙන්කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ සහ සංස්ථාවේ ගැටළු සම්බන්ධයෙන් සාධාරණ කාලයක් වෙන් කරනු ලබයි. ඊට අමතරව මාසිකව පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි වීම සහ විගණන සහ කළමණාකරන කමිටු, රැස්වීම් වල සාකච්ජා කරනු ලබන කාරණා සම්බන්ධයෙන් දන්වා යැවීම.
අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම.	සියළුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය ඇතුව සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව පාලනය කරනු ලබයි.
අධ්‍යක්ෂ මණ්ඩලය	අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් විධායක නොවන ස්වාධීන අයවේ. රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයෙක්ද, නීතිඥවරු තුන්දෙනෙකුන්ද ඉංජිනේරුවරයෙක්ද බැංකු කළමණාකරුවෙකුගෙන් සහ මහා භාණ්ඩාගාර නියෝජිතවරියගෙන්ද සමන්විත වේ. කළමණාකරනයේ සංවිධින දැනුම සහ පළපුරුද්ද සංස්ථාවේ ඉල්ලුම හා සැසැඳෙන බව මණ්ඩලය විශ්වාස කරයි.
කළමණාකරන තොරතුරු ප්‍රමානවත්ව සහ කාලීනව ලබා ගැනිම.	සංවිධානය කරන ලද කළමණාකරන තොරතුරු පද්ධතියක් පවතින බව. අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර ඇතුලත් නිවැරදි සහ අදාල තොරතුරු කලින්ම දන්වා සිටීම. යම් අවස්ථාවක ඔවුන්ට ලැබෙන තොරතුරු තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් ඔවුන් විසින් අමතර තොරතුරු කැඳවනු ලබන අතර, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයද දැනුවත් කරනු ලබයි.
ශක්තිමත්, ස්වාධීන විධායක නොවන පුද්ගලයන්ගෙන් මණ්ඩලය සමන්විත වීම.	අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරයක් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.
අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය්‍ය සාධනය මැන බැලීම.	මණ්ඩලය කටයුතු කරනු ලබන ආකාරය පිලිබඳව මැන බැලීමට විශේෂිත වූ ක්‍රම වේදයක් නොමැත. එමනිසා අවශ්‍ය අවස්ථාවලදී මණ්ඩලයේ මූලික ක්‍රියා පටිපාටි මැන බැලීමට ස්ව අගය කිරීමක් ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී පහත දැක්වෙන ක්‍රියාකාරකම් පිලිබඳව සලකා බලනු ලබයි. • ව්‍යවස්ථාපිත රෙගුලාසි වලින් පනවා ඇති වගකීම් සහ මණ්ඩලයට ඇති වගකීම් ඉටුකිරීම.

	• ආයතනික පාලනය සහ කළමණාකරනය අධික්ෂණය. • උපයන වාර්ෂික තීරණ ගැනීම සඳහා තම මතය ලබාදීම. • අමාත්‍යාංශය යටතේ අඛණ්ඩව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම. • අඛණ්ඩව ඉංජිනේරුවන්, තාක්ෂණික ශිල්පින්, ගණකාධිකාරිවරුන් සහ අනෙකුත් පුහුණු සේවකයන් සම්බන්ධයෙන් ඇති වන පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් සැලැස්ම නිර්මාණය කිරීම. • අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාරය කළමණාකරනය කිරීම සම්බන්ධයෙන් දරන පොදු මතය
සාමාන්‍යාධිකාරිතුමා සහ ජ්‍යෙෂ්ඨ සේවක මණ්ඩලය පිළිබඳව විමසා බැලීම.	සංස්ථාවේ පරමාර්ථ සහ අරමුණු වලට අදාලව මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ සේවක මණ්ඩලය වෙනුවෙන් මූල්‍ය සහ මූල්‍ය නොවන අරමුණු දක්වනු ලැබේ.
	සංස්ථාවේ ආයතනික සැලැස්ම සහ අයවැය තුල දන්වා ඇති ප්‍රධාන ආයතනික අරමුණු සහ පරමාර්ථ සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරන මණ්ඩලයේ පෞද්ගලික අරමුණු ලෙස සැලකෙන අතර, ඔවුන්ගේ කාර්ය්‍ය සාධනය මැන බලනු ලබන්නේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.
ප්‍රධාන ගනුදෙනු	
ප්‍රධාන ගනුදෙනු සහ සංස්ථාවේ ඒකාබද්ධ ශුද්ධ වත්කම් කෙරෙහි ඒවායේ බලපෑම් හෙලිදරව් කිරීම.	ප්‍රධාන ගනුදෙනු සහ සංස්ථාවේ ඒකාබද්ධ ශුද්ධ වත්කම් කෙරෙහි ඒවායේ බලපෑම් අවශ්‍ය නැන්හිදි හෙලිදරව් කරඇත.
ගිණුම්තැබීම සහ විගණනය	
මූල්‍ය වාර්තාකරනය	
සංස්ථාවේ වර්තමාන තත්ත්වය සහ ඉදිරිය පිළිබඳව හෙලිදරව් කිරීම.	සංස්ථාවේ කටයුතු පිළිබඳව සාධාරණ ආගනනය කිරීමක් සඳහා කාර්තු වාර්තා ඔවුන් විසින් දෙනු ලැබූ විශේෂිත ආකෘති කිහිපයකට අනුව පිළියෙල කොට කාලීනව මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරනු ලබයි. මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිති පදනම් කරගෙන සකසා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතයන් අනුවය. එමනිසා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණවත් අයුරින් ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත හා එකඟ වේ.
වාර්ෂික වර්තාව තුල සභාපතිගේ ප්‍රකාශන ඇතුලත් කිරීම.	මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක. **04** සහ **05** සභාපතිගේ වාර්තාව දක්වා ඇත.
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ඇතුලත් ප්‍රකාශයක් හා ඔවුන්ගේ වාර්තා කිරීමේ වගකීම් දැක්වෙන විගණකාධිපතිගේ ප්‍රකාශය	මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක. **25** යටතේ මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සම්බන්ධව ප්‍රකාශයක්ද පිටු අංක **27** සිට **43** දක්වා **2015** දෙසැම්බර් **31** න් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශය සම්බන්ධ විගණකාධිපතිගේ වාර්තාවද ඇතුලත් වේ.
අභ්‍යන්තර පාලන	
මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු වල අනුකූලතාවය සහ සංස්ථාවේ වත්කම් ආරක්ෂා වන ආකාරයේ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම.	කළමණාකාරිත්වය විසින් ඵලදායක අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කර ඇති බව හා ඒ තුලින් නෛතික මූල්‍ය නීති, අමාත්‍යාංශ සහ භාණ්ඩාගාරයේ මගපෙන්වීම් සහ අනෙකුත් නීති රෙගුලාසි හා එකඟ වන බවටත් සහතික වීම.

මගපෙන්වීම.	i. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ගනු ලබන තිරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නිලධාරින්ට දන්වා සිටීම සහ පෙරලා එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම. ii. මෙහෙයුම් මූල්‍ය සහ සේවකයන් සම්බන්ධව කාරනා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වා සිටිය යුතු කාරනා සම්බන්ධව සාකච්ඡා කරන ජ්‍යෙෂ්ඨ සේවක රැස්වීම් වසරකට 2 වරක් පවත්වනු ලබන්නේ සියලුම අංශ ප්‍රධානීන් හා ප්‍රධාන ඉංජිනේරුවන් සහභාගීත්වයෙනි. iii. ඉදිකිරීම් අංශය සහ කොන්ක්‍රීට් අංගන සඳහා සෑම මසකම ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. මේ සඳහා සියලුම ව්‍යාපෘති සහ අංගන කළමණාකරුවන් සහභාගි වන අතර, අවසානයේ ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයටද වාර්තා කරනු ලබයි.
විගණන කමිටු සහ විගණකවරු	
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විගණන කමිටුව සහ ඒ පිළිබඳව වාර්ෂික වාර්තාවේ ඇතුලත් වාර්තාව	විගණන කමිටුවේ මූලසුන දරනුයේ අධ්‍යක්ෂ මෙන්ම භාණ්ඩාගාරයේ නියෝජිතවරයා විසිනි. අනෙකුත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු මෙම කමිටුවට ඇතුලත් වේ.. විගණකාධිපති දේපාර්තමේන්තුවේ නියෝජිතයා සහ අමාත්‍යාංශ නියෝජිතයා මේ සඳහා සහභාගි වනු ලබන්නනේ ආරාධනාව මතයි.
විෂය මූලික බව සහ ස්වාධිනත්වය සහතික වීම පිණිස බාහිර විගණකයන් සමග යෝග්‍ය අයුරින් සම්බන්ධකතා ගොඩනාගා ගෙන පවත්වාගෙන යනු ලබයි.	රා.සං.හා.නි.නී. සංස්ථාව විසින් විගණකයන්, විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙනයනු ලබයි.
පරිඝණ මණ්ඩලය	2015.12.31 දිනට දේපල, යන්ත්‍ර සහ උපකරණ ආගණනය කරඇත.

ආයතනික පාලනය හෙලිදරව් කිරීම.	
සංස්ථාව තුල පනවා ඇති ආයතනික පාලනය හෙලිදරව් කිරීම.	ආයතනික යහ පාලනය සහ එය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන මගපෙන්වීම් අනුව කාර්යක්ෂම ක්‍රියාපටිපාටි හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම තුලින් යහ පාලනය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනුලබයි. මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද සිද්ධාන්ත සහ ක්‍රියාවන් දැනටමත් සංස්ථාව තුල ක්‍රියාත්මක වන බව සටහන් කිරීමට කැමැත්තෙමි. දැනට සංස්ථාව තුල ක්‍රියාත්මක නොවන පරිචයක් අනලොස්සක් සඳහා ඒවා නිවැරදි කිරීමටත් අවශ්‍ය පියවර ගෙන තිබේ. එමෙන්ම යහ පාලනය සම්බන්ධයෙන් ඇති යෝජනා සහ මග පෙන්වීම් තුලින් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල මෙහෙයුම් ආකෘතිය සහ නීති පරිසරය වැඩි දියුණු කරනු ලබන බවට විශ්වාස කෙරේ.

මෙහෙයුම් සහ මූල්‍ය කටයුතු සමාලෝචනය

සංස්ථාවේ වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන මගින් සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සමාලෝචනය කරයි. මෙහෙයුම් සහ මූල්‍ය විග්‍රහ මගින් ආයතනයේ මෙහෙයුම් සහ මූල්‍ය ක්‍රියාකාරිත්වය විග්‍රහ කරනු ලබයි.

සංස්ථාවේ ක්‍රියාකාරිත්වය

සංස්ථාවේ **2015** වර්ෂයේදී රුපියල් මිලියන **2,429** ක පිරිවැටුමක් වාර්තා කළ අතර, එය පෙර වර්ෂයේදී රු. මිලියන **3,466** ක් විය. මෙම පිරිවැටුම පහළ යෑම ප්‍රධාන කොටම ප්‍රමාණවත් කොන්ත්‍රාත් සංඛ්‍යාවක් නොමැතිවීම නිසා සිදු වුණි. සංස්ථාව **2015** වර්ෂයේදී බදු පෙර ලාභ වශයෙන් රුපියල් මිලියන **50.3** ක් ඉපයීය. මෙය පෙර වර්ෂයේ බදු පෙර ලාභය වන රුපියල් මිලියන 112.4 ට සාපේක්ෂව සැලකිය යුතු පහළ යෑමකි.

පිරිවැටුම දල ලාභය සහ ශුද්ධ ලාභය පිළිබඳ විශ්ලේෂණය



ශුද්ධ වත්කම්



අංශික කාර්ය සාධනය



<u>ඉදිකිරීම් අංශය</u>

නිර්මාණ අංශය මගින් ඉදිකිරීමේ ව්‍යාපෘති කාර්ය සාධනය මෙහෙයවනු ලබන අතර, මෙහිදි වැඩ සටහන් සැකසීම, සම්පත් අවශ්‍යතාවයන් තීරණය කිරීම, බිල්පත් ඉදිරිපත් කිරීම හා අනුමත කර ගැනීමට කාල වකවානු තීර්ණය කිරීම යන ආදි කරුණු අදාල කර ගනී. පසුගිය වසරට සාපේක්ෂව මෙම වර්ෂයේදී ඉදිකිරීම් පිරිවැටුම සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර, ප්‍රමාණවත් ව්‍යාපෘති නොමැති වීම මෙයට බලපා ඇත. එහිදි පසුගිය වර්ෂයේදී මෙන් බිල්පත් සඳහා ගෙවීම් කිරීමේදි ඇති වූ ප්‍රමාදයන්ට ද මුහුණ දෙන ලදී. කෙසේ නමුත් සංස්ථාවේ කළමණාකාරිත්වය විසින් මෙම ප්‍රමාදයන්ට ස්ථිර විසඳුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී.

ඉදිකිරීම් පිරිවැටුම



ව්‍යාපෘති මගින් ලැබූ ආදායම 2014 වර්ෂයේදී රුපියල් මිලියන 2,449 සිට 2015 වර්ෂයේදී රුපියල් මිලියන 1,905 දක්වා පහත වැටී ඇත. ඉදිකිරීම් අංශය සංස්ථාවේ මුලු පිරිවැටුමෙන් 78.4% ක දායකත්වයක් ලබාදී ඇත. මෙම අංශය විසින් සලකා බලන වර්ෂය තුලදී රුපියල් මිලියන 399 ක් බදු පෙර ලාභ ලෙස උපයාගෙන ඇත.

කොන්ක්‍රීට් අංගන

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාව රත්මලාන, වේරගංතොට, බෝපිටිය හා මැදවච්චිය යන ස්ථාන වල කොන්ක්‍රීට් අංගන 04ක් පවත්වාගෙන යනු ලබන අතර, පේරාදෙණිය විකුණුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබයි. සංස්ථාවේ ඉදිකිරීම් ව්‍යාපෘති තුලින් ලැබෙන සතුටුදායක දැඩි අභ්‍යන්තර ඉල්ලුමද සමග මෙම කොන්ක්‍රීට් අංගන මගින් ලංකා විදුලි බල මණ්ඩලය, දුම්රිය දෙපාර්තමේන්තුව සහ අනෙකුත් පෞද්ගලික ආයතනයන්ට අවශ්‍යය කොන්ක්‍රීට් නිෂ්පාදන වන පී. එස්. සි. බිම්, විදුලි කණු ආර්. සි. සි. පයිප්ප, පාලම් උපාංග මෙන්ම අනෙකුත් නිෂ්පාදන වන බිම් ඇතිරුම්, කොන්ක්‍රීට් ලැලි සහ ගල් මෙන්ම කුහර ගල් ද සපයනු ලැබේ.

කොන්ක්‍රීට් අංගන පිරිවැටුම



සලකා බලන වර්ෂය තුළදී කොන්ක්‍රීට් අංගන විසින් රුපියල් මිලියන 306 ක පිරිවැටුමක් වාර්තා කල අතර එය පසුගිය වර්ෂයේදී රුපියල් මිලියන 607 ක් විය. මෙය පෙර වර්ෂයට වඩා සැලකිය යුතු පහල යෑමකි. කොන්ක්‍රීට් අංගන විසින් සංස්ථාවේ සමස්ථ පිරිවැටුමෙන් 12.7% ක දායකත්වයක් ලබාදී ඇත. කොන්ක්‍රීට් අංගනයන්හි බදු පෙර ලාභයද 2014 වර්ෂයේ රුපියල් මිලියන 131 සිට 2015 වර්ෂයේ රුපියල් මිලියන 69 දක්වා අඩු වී ඇත.

වැඩ සේවාවන් සහ අනෙකුත්

මධ්‍යම යාන්ත්‍රික අංශය විසින් සපයනු ලබන සේවා පිරිවැටුම මෙසේ දක්වා ඇත. මෙහි මූලික පරමාර්ථය වන්නේ දැනට සංස්ථාව පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතිවලට අවශ්‍ය සේවා සැපයීම වේ. ඒට අමතරව මාර්ග සංඥා ඒකකය සහ පොළොන්නරුව, අම්පිරිගල තාර යන්ත්‍රෝපකරණ පිහිටි ස්ථාන මෙකි අංශය යටතේම ක්‍රියාත්මක වේ. මාර්ග සංඥා ඒකකය 2005 දී පිහිටුවනු ලැබූ අතර, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් මාර්ග සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම සහ නඩත්තුව කරනු ලබයි.

වැඩ සේවාවන් සහ අනෙකුත් කටයුතු මගින් රුපියල් මිලියන 217 ක පිරිවැටුමක් අත්කරගෙන ඇති අතර එය පෙර වර්ෂයේ පිරිවැටුම වන රුපියල් මිලියන 409 ට සාපේක්ෂව සැලකිය යුතු පහල යෑමකි. 2015 වර්ෂය තුලදී වැඩ සේවාවන් සහ අනෙකුත් කටයුතු මගින් සංස්ථාවේ මුලු ආදායමෙන් 8.9% ක දායකත්වයක් සපයා ඇත.

දැනට කරමින් පවතින ව්‍යාපෘති වල ප්‍රගතිය සම්බන්ධව 2015-12-31 වන දිනට සාරාංශය

සංකේතය	ව්‍යාපෘති නාමය	නියම/ සංශෝධිත කොන්ත්‍රාත්තු වටිනාකම	2015 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය	ප්‍රගතිය
			ආදායම (රු. මිලියන)	භෞතික %
පාලම්				
994	පාලම් ඉදිකිරීම් මොරගහකන්ද - වැල්ලවල පාර (කළු ගඟ වම්පස ඉවුරු සංවර්ධනය.	126.45	120.62	95%
998	අංක 84. තලගල පාර කොට්ටාවෙහි පාලම නැවත ඉදිකිරීම.	42.76	40.62	95%
873	උලපනේ පාලම	105.77	100.82	95%
1011	අංක 18/6 -19/8 පලුගම බොරලන්ද හපුතලේ පාලම් වැඩබිම.	61.98	60.74	98%
1012	ගල්ඔය සහ පාලම සල්ගස්හන්දිය ඇළ මාර්ගය සම්බන්ධ කරන පාලම.	80.47	62.37	78%
1083	යෝජිත කිරිබත්ගොඩ බස්නැවතුම්පල අසල ඇළ හරහා ඉදිකරන පාලම.	6.14	6.14	100%
1084	කොළමුණු ඔය පාලම හුන්ගම කොනොගම පාර.	39.73	28.87	73%
1093	යෝජිත පාලම පළල් කිරීම බිලුමැත්ඩල් පාර.	40.61	39.80	98%
පාරවල්				
979-982	ප්‍රාදේශීය මාර්ග තාර දැමීම - කෑගල්ල දිස්ත්‍රික්කය.	4567.6 (Approx.)	3,603.22	79%
1068	මාර්ග සංඥා පද්ධතිය ගාලු පාර ආර්. ඒ. ද. මැල් මාවත පැකේජ් B සහ C.	97.78	82.73	85%
1069	දෙහිවල සත්වෝද්‍යානය මාර්ග අංක 5 දෙහිවල සත්වෝද්‍යානය මාර්ග අංක 6 දෙහිවල සත්වෝද්‍යානය රථගාල දෙහිවල සත්වෝද්‍යානය අශ්වගාල	84.51	42.26	50%
1070	දුම්රිය පාර මාරුව ඉදිකිරීම (ගල් තාර දැමීම) පලෙයි සහ කොඩිකාමන් - අදියර iii	78.07	52.44	67%
1092	සැපයුම් හා සංයුක්ත (තාර දැමීම) කොළඹ පාරවල්	-	39.71	
1095	තලේමන්නාරම ජැටිය ඉදිකිරීම.	20.27	18.24	90%
1100	නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම කොළඹ -15.	50.34	28.27	56%
1101	නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම කොළඹ -08.	5.11	2.83	55%
1102	නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම කොළඹ -06.	9.18	8.41	92%
1103	නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම කොළඹ -01.	29.12	19.62	67%
1104	නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම කොළඹ -01.	6.55	1.18	18%
1105	නිවාස සංකීර්ණයේ අලුත් වැඩියා කටයුතු කිරීම කොළඹ -07.	0.67	-	-

ගොඩනැගිලි				
996	සැලසුම් කාර්යාලය ii පියවර1-කලාපය 1 ඉංජිනේරු පීඨය -පේරාදෙණිය.	29.47	28.88	98%
997	අම්පාර උසස් අධ්‍යාපන ආයතනයේ නව ඉදිකිරීම් නේවාසිකගාර අංක 01 සහ ශාරීරික සුවතා මධ්‍යස්ථානය.	378.57	216.99	57%
1009	සහස්ශ්‍රපුර සහ සිංහපුර නිවාස සංකීර්ණය අදියර i .	66.32	61.36	93%
1073	අඳුන් වැඩියා කිරීම හා තින්ත ආලේපනය නිවාස සංකීර්ණය - මොරටුව.	18.26	13.10	72%
1075	අඳුන් වැඩියා කිරීම හා තින්ත ආලේපනය කැටවලමුල්ල නිවාස සංකීර්ණය - කොළඹ 09.	30.92	17.98	58%
1077	අඳුන් වැඩියා කිරීම හා තින්ත ආලේපනය මල්ලිකාරාම නිවාස සංකීර්ණය - කොළඹ 09.	9.48	7.47	79%
1078	අඳුන් වැඩියා කිරීම හා තින්ත ආලේපනය ජයවඩනගම නිවාස සංකීර්ණය - බත්තරමුල්ල.	9.32	4.39	47%
1079	අඳුන් වැඩියා කිරීම හා තින්ත ආලේපනය ඩැනියෙස්ට ද සිල්වා මාවත නිවාස සංකීර්ණය - කොළඹ 09.	11.47	7.73	67%
1076	අඳුන් වැඩියා කිරීම හා තින්ත ආලේපනය සර් ජෙම්ස් පිරිස් මාවත නිවාස සංකීර්ණය - කොළඹ 02.	7.11	4.10	58%
09. දිස්ත්‍රික් ලේකම් කාර්යාල - කැගල්ල				
01	මාතෘ සායනය ඉදිකිරීම - 06	50.60	45.38	90%
02	සති පොළ ඉදිකිරීම - 02	34.97	21.72	62%
03	බස් නැවතුම ඉදිකිරීම - 02	25.64	20.10	78%
10. දිස්ත්‍රික් ලේකම් කාර්යාල - කුරුණෑගල				
01	මාතෘ සායනය ඉදිකිරීම – 14	147.86	122.62	83%
02	සති පොළ ඉදිකිරීම - 07	183.37	150.90	82%
03	බස් නැවතුම ඉදිකිරීම - 01	24.78	23.48	95%
11. දිස්ත්‍රික් ලේකම් කාර්යාල - පුත්තලම				
01	මාතෘ සායනය ඉදිකිරීම - 06	81.33	64.56	79%
02	සති පොළ ඉදිකිරීම.-04	64.90	56.57	87%
03	ඇවිදින මං තිරු ඉදිකිරීම - 02	13.34	12.55	94%
04	බස් නැවතුම ඉදිකිරීම - 01	94.78	76.21	80%
05	වෙරළ උද්‍යාන ඉදිකිරීම - 01	25.47	18.61	73%
06	ආදාහනාගාරය ඉදිකිරීම - 01	10.72	1.88	18%
986	කර්මාන්තශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම පොලිටෝ ලංකා - හොරණ BOI කලාපය.	26.95	23.40	87%

1096	බස් නැවතුම් පොළ ඉදිකිරීම ලුනුගම්වෙහෙර.	18.72	17.25	92%
1097	බස් නැවතුම් පොළ ඉදිකිරීම වලස්මුල්ල.	35.65	32.98	93%
1098	පුනුරුත්ත්‍රාපනය කිරීම මීගමුව ජාතික රෝහල.	500.00	261.89	52%
1090	සතිපොළ ඉදිකිරීම ව්‍යාපෘතිය වාඩිගල.	18.41	0.68	4%
1091	සතිපොළ ඉදිකිරීම ව්‍යාපෘතිය පන්නේගමුව	80.38	11.56	14%
1088	සතිපොළ ඉදිකිරීම ව්‍යාපෘතිය කරමැටිය.	38.07	5.94	16%
1089	සතිපොළ ඉදිකිරීම ව්‍යාපෘතිය බණ්ඩාරවත්ත	21.63	9.38	43%
1099	ආලෝකපුර මහල් නිවාස සංකීර්ණය හම්බන්තොට.	1.03	0.98	95%
1106	දෙහිවල හිල්ඩා මහල් නිවාස සංකීර්ණයේ අඳුන් වැඩියා කටයුතු කිරීම.	19.59	10.73	55%
1107	ලුනාව සමෘර්දි ශක්ති නිවාස සංකීර්ණයේ අඳුන් වැඩියා කටයුතු කිරීම.	23.00	10.65	46%
1108	මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතියේ ලග්ගල රෝහල ඉදිකිරීම.	164.11	9.72	6%
1110	සැලසුම් කාර්යාලය ii පියවර1-කලාපය 111 ඉංජිනේරු පීඨය -පේරාදෙණිය.	32.10	2.39	7%
ජල සැපයුම් වාරිමාර්ග සහ ජල ශක්ති බලාගාරය				
1071	ඇළමාර්ගය සකස් කිරීම C7 – සෙවනගල - වලවේ අතර.	81.87	49.74	61%
1094	රත්කිඳ ප්‍රධාන ඇළ මාර්ගය ඉවුර සංවර්ධනය.	86.83	31.28	36%
1082	පුනුරුත්ත්‍රාපන ජල සැපයීම ගෙගරි ඇළ	271.05	126.06	47%
1111	මැදිරිය ඇතුලු හා ඉතිරි වැඩ ඉදිකිරීම් බණ්ඩාරපුර පෝෂක ප්‍රදේශ පොදු වැඩ.			
01. විවිධ (වෙනත්) ව්‍යාපෘති				
1081	රත්පොකුණුගම නිවාස සංකීර්ණයේ මලදුව්‍ය ප්‍රවාහනය බැහැර කිරීමේ මාර්ග පද්ධතිය ඉදිකිරීම	22.65	18.28	81%
02. කොන්ක්‍රීට් අංගත				
051	රත්මලාන		133.51	
053	බෝපිටිය		65.74	
052	වේරගංතොට		78.69	
812	මැදවච්චිය		32.51	
03. උපදේශක මණ්ඩලය				
01	උපදේශක මණ්ඩලය		8.10	
04. යාන්ත්‍රික අංශය				
01	ප්‍රවාහන		37.26	
02	මාර්ග සංඥා පද්ධති		137.00	
03	තාර ඇතිරීම.		89.50	
04	ගල් ඇතිරීම්		2.50	

කොලමුණු ඔය පාලම හුන්ගම පාර



තලෙයිමන්නාරම් පාර

කොට්ටාව - තලගල පාර

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පන්තේගමුව සතිපොල

ග්‍රෙගරි ඇල

ගල්ඔය පාලම

මීගමුව ජාතික රෝහල

මානව සම්පත් සමාලෝචනය

මානව සම්පත් සංස්ථාවේ ප්‍රධාන වත්කම වේ. සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මානව සම්පත කායිකව හා මානසිකව තෘප්තිමත් වියයුතුය. .

මානව සම්පත සංවර්ධනය කිරීම උදෙසා සංස්ථාව නිරන්තරයෙන්ම ආයෝජනය කරනු ලබන අතර, නිරන්තරයෙන් වෙනස් වන ව්‍යාපාරික පරිසරය තුල කාර්යය මණ්ඩල හැකියාවන් ඕනෑම ආයතනයක ශක්තිය බව අප ආයතනයේ විශ්වාසයයි. එම නිසා පුරෝකථනය කරන ලද ප්‍රතිඵල ලබාගැනීමට පුහුණු දක්ෂ ශ්‍රම බලකායක් ඇති කිරීමට සියළු උත්සාහයන් දරනු ලැබේ.

2015 වර්ෂය තුල සේවකයින්ගේ සංතෘප්තිය හා අභිප්‍රේරනය ඉහල දැමීමට හා හැකියාවන් වර්ධනය කිරීමට සහ ප්‍රමිතිය පවත්වා ගැනීමට වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ඉදිරියේදී ද සංස්ථාවේ ඉලක්ක හා අරමුණු ඉටු කරගැනීම සඳහා මානව සම්පත් අංශය ක්‍රියාකරනු ඇත.

1. <u>සේවක උසස්වීම්</u>

   උසස්වීම් ලැබීමට සුදුසුකම් ඇති සියලුම කාර්යය මණ්ඩල සාමාජිකයන්ට 2015 වර්ෂයේ උසස් වීම් ලබාදෙන ලදී.

2. <u>සේවක සුභ සාධනය.</u>

   ආයතනයේ අනුග්‍රහය ඇතිව පවත්වා ගෙන යනු ලබන සේවක වෛද්‍ය රක්ෂණාවරණය සහ සේවක වන්දි රක්ෂණාවරණය මේ වර්ෂයේදී ද අලුත් කරන ලදී.

   2015 අප්‍රේල් සහ දෙසැම්බර් යන මාස වල සේවකයින් හට ප්‍රසාද දීමනා ගෙවීම් ද කරඇත.
   සංස්ථාවේ සේවකයින්ට ගෙවීමේ පදනම මත ගෘහ උපකරණ සහ විදුලි උපකරණ මිලට ගැනීමේ අවස්ථාව උදාකර දී ඇත.

3. <u>වැටුප් වර්ධක</u>

   රජය මගින් දෙනු ලැබූ උපදේශයන්ට අනුව අන්තර් දීමනාව රු.7,000/- කින් වැඩි කරන ලදී.

4. <u>සේවකයින් සෞඛ්‍ය තත්ත්වය නංවාලීම.</u>

   2015 වර්ෂයේදී සංස්ථාවේ රත්මලාන පරිශ්‍රයේ සංස්ථාවේ සියලුම සේවකයන් වෙනුවෙන් වෛද්‍ය සායනයක් (අක්ෂි, පිළිකා හා දියවැඩියා) පැවැත්වීම.

5. <u>සේවකයින් ඇගයීම.</u>

   අවුරුදු 25 ක අඛණ්ඩ සේවා කාලයක් සපුරන ලද සේවකයින් ඇගයීම සඳහා උපහාර උළෙලක් සංස්ථාවේ 44 වන සංවත්සරයට සමගාමීව පවත්වන ලද අතර, එහිදී ඔවුන් හට රන් කාසියක් හා තිලිණයක් බැගින් ප්‍රදානය කරන ලදී. 2015 වර්ෂයේදී සංස්ථාවේ කාර්යය මණ්ඩලයට පැමිණීමේ දීමනාවක් ගෙවන ලදී. (ඉංජිනේරුවන්ට රුපියල් 15,000/- සහ අනෙකුත් සේවකයන්ට රුපියල් 5,000/-)

6. <u>බාහිර ආයතන සඳහා සපයන ලද පුහුණුව</u>

   රටේ පොදු සංවර්ධන කටයුතු වලට දායකවීමක් ලෙස විශ්ව විද්‍යාල සහ ජාතික ආධුනිකත්ව මණ්ඩල වැනි බාහිර ආයතන විසින් යොමු කරනු ලබන පුද්ගලයින් හට ඉදිකිරීමේ ක්ෂේත්‍රයේ විවිධ අංශ තුල මනා පුහුණුවක් ලබා දීම සිදුකරනු ලබයි..

අපගේ සේවක ශක්තිය

තනතුරු	2010	2011	2012	2013	2014	2015
සිවිල් ඉංජිනේරුවරුන්	48	59	54	44	40	47
යාන්ත්‍රික/විදුලි ඉංජිනේරුවරුන්	09	12	10	12	10	10
ජ්‍යෙෂ්ඨ නිළධාරීන්	03	03	03	03	03	03
ගණකාධිකාරිවරුන්	06	08	08	08	07	05
වෙනත් නිළධාරීන්	10	16	17	16	14	16
අධිකාරීවරුන් (යාන්ත්‍රික/සිවිල්/විදුලි)	20	19	23	26	23	24
සැලසුම්කරු/ප්‍රමාණ සමීක්ෂක	02	03	03	02	02	04
ආරක්ෂක සේවක	34	29	25	29	35	39
ලිපිකරු හා සම්බන්ධ තනතුරු	88	95	98	86	90	91
සුපවයිසර් හා අනෙකුත් පුහුණු	286	294	309	311	299	313
එකතුව	**506**	**538**	**550**	**537**	**523**	**552**

විගණන කමිටු වාර්තාව

විගණන කමිටු වාර්තාව - 2015

පොදු ව්‍යාපාර චක්‍ර ලේඛණ අංක. PED **55** දරණ **2010/12/14** දිනැති චක්‍ර ලේඛණය මගින් විගණන කමිටු ව්‍යවස්ථාපිත කිරීමට ප්‍රතිපාදන සපයන ලදී.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතයන්ට අනුගත වී ඇත්දැයි සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලව වී ඇත් ද යන්න පිළිබඳව සහ අනෙකුත් අදාල උපදේශයන් රජය මගින් නිකුත්කරන චක්‍ර ලේඛණ සඳහා අනුගත වී ඇත්ද යන්න අඛණ්ඩව සොයා බලා එහි අනුගත නොවීම් ඇත්නම් අවශ්‍යය උපදෙස් සැපයීම, අභ්‍යන්තර මෙන්ම බාහිර විගණන වාර්තා බැලීම, සමාලෝචනය කිරීම පොදු ව්‍යාපාර කාරක සභා සහ කළමණාකරණ ලිපි සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උදව් වීම, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම තුලින් විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය වේ.

විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විතවන අතර, එහි මූලසුන හොබවනු ලබන්නේ භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂවරයෙකු විසිනි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් එහි නියෝජිතයෙක් සහ රේඛිය අමාත්‍යාංශය විසින් නම් කරන ලද එහි ප්‍රධාන අභ්‍යන්තර විගණක චක්‍රලේඛණ ප්‍රකාරව නිරීක්ෂකවරු ලෙස මෙම කමිටුවට සහභාගි වේ.

2015 මූල්‍ය වර්ෂය සඳහා විගණන කමිටු **03** ක් පවත්වන ලදී.

- **2016** වර්ෂය සඳහා පිළියෙල කරනලද අභ්‍යන්තර විගණන වැඩසටහන සමාලෝචනයකර අනුමත කිරීම.

- **2012** සහ **2013** වර්ෂ සඳහා වාර්ෂික වාර්තා නිකුත් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම.

- අභ්‍යන්තර විගණන වාර්තා පදනම් කරගෙන හඳුනාගත් ගැටළු නිවැරැදි කිරීමට ආයතන කළමණාකාරිත්වය සහ අංශ ප්‍රධානීන් ප්‍රතිචාර දැක්වූ ආකාරය සමාලෝචනයට භාජනය කිරීම,

- මිලදී ගැනීම්, ගබඩා, මෙහෙයුම්, බිල් තැබීම්, මුදල් සහ මානව සම්පත් යනාදි අංශවල අභ්‍යන්තර පාලන ක්‍රම කිහිපයක් සම්බන්ධව සමාලෝචනයට භාජනය කිරීම සහ සුදුසු නිර්දේශයන් ඉදිරිපත්කිරීම.

- කමිටුවේ නිර්දේශයන් සම්බන්ධව අදාල කළමණාකරුවන් සහ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරනලද පසු විපරම් කිරීම් සමාලෝචනයට භාජනය කිරීම,

- **2013** වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විගණකාධිපති අවසන් වාර්තාව සමාලෝචනයට භාජනයකල අතර ගිණුම්කරණ අඩුපාඩු සහ නීතිරීති වලට අනුකූල නොවීම් නිවැරැදි කිරීම් පිළිබඳව පසුවිපරම් කරන ලදී.

- රජය විසින් නිකුත් කරනලද අදාල නීතිරීති, රෙගුලාසි සහ චක්‍රලේඛණ වලට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න අවධානය යොමු කිරීම.

- 2016 වර්ෂය සඳහා වාර්ෂික අයවැය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම.

- 2014 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම.

- 2016 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම.

- 2016 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම.

- විගණකාධිපති විසින් යොමු කරන ලද කරුණු සම්බන්ධයෙන් සංස්ථාවේ කළමණාකාරිත්වය විසින් ඉදිරිපත් කරන ලද අදහස් සැලකිල්ලට භාජනය කිරීම.

විගණන කමිටුවේ කාර්ය්‍ය පැවරුම් නියමයන් සියළු ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධයෙන් අනුකූල බව කමිටුවේ මතයයි.

කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විතය.

01). ජී. ඒ. අජිත් ප්‍රියන්ත මහතා - සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ භාණ්ඩාගාරයේ නියෝජිත

02). මර්වින් එන්. ද සිල්වා මහතා - සාමාජික/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

03). එස්. ඒ. ඩී. පී. ගුණවර්ධන මහතා - සාමාජික/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජී. ඒ. අජිත් ප්‍රියන්ත

සභාපති - විගණන කමිටුව

මූල්‍ය වාර්තා සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් දැක්වෙන වාර්තාව.

පහත දැක්වෙන ප්‍රකාශනය මගින් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වගකීම් දක්වා ඇත. මෙය විගණන වාර්තාවේ දක්වා ඇති විගණනවරුන්ගේ වගකීම් වලින් වෙනස් වේ.

අධ්‍යක්ෂවරුන් විසින් සෑම වර්ෂයකදීම සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් වර්ෂ අවසානයේදී පැවති තත්ත්වය සහ වර්ෂය තුලදී සංස්ථාවේ ලාභ අලාභ පිළිබඳව සත්‍ය සහ සාධාරණ තත්ත්වයන් පිළිඹිබුවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කලයුතුය. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව තෝරා ගැනීම සහ භාවිතා කිරීම, සාධාරණ සහ විවක්ෂණ තීන්දු ගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම සහ අදාල ගිණුම් ප්‍රමිතීන් භාවිතා කිරීම සිදුකර ඇත.

සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව හෙළිදරව් කිරීමටත් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා මහ භාණ්ඩාගාරය විසින් වක්‍රලේඛ මගින් සහ මුදල් පනත මගින් ලබාදී ඇති මාර්ගසූචක අනුගමනයකර ඇති බවටත් තහවුරු කරගැනීමට අවශ්‍යය ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. ඔවුන් විසින් සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ ක්‍රියාමාර්ග ගැනීමට බැඳී සිටියි. ඒ අනුව වංචා සහ අනෙකුත් අක්‍රමිකතා නැවැත්වීමට සහ හෙළිදරව් කර ගැනීමට අවශ්‍යය සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් ගොඩනැගීමට කටයුතු කල යුතුය.

ව්‍යාපාරය අඛණ්ඩව පවති යන උපකල්පනය මත පදනම් වී අධ්‍යක්ෂවරුන් විසින් ගිණුම් පිළියෙළ කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් විසින් 2016 වර්ෂය සඳහා සංස්ථාවේ අයවැය වාර්තා, මුදල් ප්‍රවාහ, අනාගත ව්‍යාපෘති සහ ණය පහසුකම් පිළිබඳව විමසා බලා ඒවා සමාලෝචනය කිරීමෙන් පසු රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව සතුව මෙහෙයුම් තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍යය සම්පත් ඇති බව තීරණය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,
රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව,



චමින්ද එදිරිවික්‍රම
සභාපති

දස අවුරුදු කාර්යය සාධන සාරාංශය

විස්තරය	2006 (රු.)	2007 (රු.)	2008 (රු.)	2009 (රු.)	2010 (රු.)	2011 (රු.)	2012 (රු.)	2013 (රු.)	2014 (රු.)	2015 (රු.)
1. පිටිවැටුම	866,706,964	801,530,218	1,661,599,002	1,466,146,925	1,671,679,005	2,564,139,185	3,534,179,480	3,565,830,370	3,466,394,952	2,429,513,031
2. මෙහෙයුම් වියදම්	778,395,748	640,686,287	1,433,374,873	1,135,532,405	1,448,476,239	2,288,062,266	3,421,538,609	3,439,676,689	3,234,011,015	2,193,414,947
3. දළ ලාභය	88,311,216	160,843,931	228,224,129	330,614,520	223,202,767	276,076,919	112,640,871	126,153,681	232,383,938	236,098,085
4. අනෙතුත් ආදයම්	34,860,613	29,943,947	38,134,293	27,981,723	26,062,984	32,857,265	172,380,088	199,234,550	171,015,809	176,631,024
5. පරිපාලන වියදම්	81,774,444	123,463,375	125,068,134	122,178,408	142,633,691	143,558,270	133,379,468	170,114,913	180,308,429	201,089,843
6. අනෙකුත් වියදම්	3,910,389	7,102,694	10,274,230	16,418,049	3,637,713	57,476,813	22,896,549	9,582,288	22,928,839	77,026,709
7. මූල්‍ය වියදම්	15,324,228	17,985,859	78,542,597	118,657,428	80,620,389	65,582,132	62,872,698	67,646,914	93,350,261	87,193,708
8. බදු වලට පෙර ශුද්ධ ලාභය	22,162,767	42,235,949	52,473,459	101,342,358	22,373,957	42,316,969	65,872,244	97,208,693	112,449,561	50,339,247
9.මුළු වත්කම්	1,819,160,861	2,114,755,333	2,449,643,021	2,626,565,287	2,443,174,386	3,558,253,858	5,115,747,833	4,892,581,938	4,476,521,639	4,223,624,771
10.ශුද්ධ වත්කම්	934,220,347	960,188,471	1,002,231,695	1,091,458,958	854,278,282	819,601,521	1,871,466,720	1,792,746,938	1,756,545,931	1,557,239,276
11. යෙදූ වූ ප්‍රාග්ධනය මත ඉපැයීම්	2	3.7	5	11.1	5.5	7.2	3.6	5.89	6.85	3.5
12. වත්කම් මත ඉපැයීම්	1.22	2.00	2.14	3.86	0.92	1.18	1.29	1.99	2.57	1.19
13. දළ ලාභය අනුපාතය %	10.19	20	14	23	13	10.77	3.19	3.54	6.7	9.71
14. ශුද්ධ ලාභය අනුපාතය %	2.56	5	3	7	1.34	1.64	1.86	2.73	3.2	2.0
15. ජංගම අනුපාතය	1:20	1:22	1:28	1:47	1.30	1.10	1.20	1.06	1.02	1.04

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } CEN/C/SDCC/FA/15 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 26 June 2017

The Chairman,

State Development and Construction Corporation.

Report of the Auditor General on the Financial Statements of the State Development and Construction Corporation for the year ended 31 December 2015 in terms of Section 14(2)(c) of the Finance Act, No.38 of 1971.

Reference to my letter of even number dated 20 April 2017 on the above subject.

02. The above mentioned reports is sent herewith.

W. Premananda

Deputy Auditor General

For Auditor General

Copy: 1. Secretary, Ministry of Housing and Construction

2. Secretary, Ministry of Finance and Mass Media

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සිරිඑන්/සි/එස්ඩීසිසි/එෆ්ඒ/15 මෙයේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 අප්‍රේල් 20 දින

සභාපති,
රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ (රාසංනිනීස) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රතිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ

එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට(ශ්‍රීලංගිප්‍ර)/ (ශ්‍රීලංමූවාප්‍ර) අනුකූල වීම.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රීලංගිප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ප්‍රමිතියේ විධිවිධානයන්ට පටහැනිව, ඉදිකිරීම් ණයගැනියන් සහ වැටුප් හා වේතන අත්තිකාරම් ගිණුමේ පිළිවෙලින් රු. 39,802,226 ක් හා රු. 1,384,951 ක් වූ අසාමාන්‍ය බැර ශේෂයන් එහි හර ශේෂයන්ට එරෙහිව හිලව් කර නිබුණු අතර සේවාදායකයන්ගෙන් ලද වැඩ පූර්ව අත්තිකාරම්වල රු. 84,429,049 ක් වූ අසාමාන්‍ය හර ශේෂයක් 2014 දෙසැම්බර් 31 දිනට එහි බැර ශේෂයට එරෙහිව හිලව් කර නිබුණි. එබැවින් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ජංගම වගකීම් හා ජංගම වත්කම් සමාන මුදල් ප්‍රමාණවලින් අඩුවෙන් දක්වා නිබුණි.

(ආ) ශ්‍රීලංගිප්‍ර 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා දෝෂ

ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සඳහන් පරිදි ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබූ හෙයින් රු. 331,051,319 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් විෂයයන් 1,440 ක්, ඒවා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් භාවිතා කරමින් පැවතුණි.

(ඇ) ශ්‍රීලංගිප්‍ර 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

සීමාසහිත ඩෙව්කොෂෝවා (පුද්ගලික) සමාගම සංස්ථාවේ සම්පූර්ණ අයිතිය සතු සමාගමක් වුවද සංස්ථාව විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ඇ) ශ්‍රීලංගිප්‍ර 11 - ඉදිකිරීම් කොන්ත්‍රාත්

ප්‍රමිතියේ 12 ඡේදය අනුව, කොන්ත්‍රාත්තුව නිම කිරීමේදී, කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාදයන්ගෙන් පැන නගින දඩ මුදල් ආවරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත් ආදායම් මුදල අඩුවේ. ලැබුණු තොරතුරු අනුව, සංස්ථාවට (කොන්ත්‍රාත්කරු) වරින් වර කරන ලද ගෙවීම් වලින් රු. 117,672,342 ක් වූ ප්‍රමාද ගාස්තු සේවා දායකයන් දෙදෙනෙකු විසින් අඩු කර තිබුණි. කෙසේවුවද, ලැබීම පිළිබඳ ප්‍රමාණාත්මක සාක්ෂි නොමැතිව එම මුදල ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක නොවූ හා නිමකර පෙර වර්ෂ තුළ දී භාරදෙන ලද ව්‍යාපෘති වලට අදාළව රු. 87,587,852 ක් වූ ප්‍රමාද ගාස්තු සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදල් ලෙස දක්වා තිබුණි. එම ප්‍රමාද ගාස්තු ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කිරීම විචක්ෂණ නොවන බව විගණනයේදී අනාවරණය විය.

(ඉ) ශ්‍රීලංගිප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ විෂයයක් ප්‍රත්‍යාගණනය කරන්නේ නම්, එම වත්කම් අයත් දේපල, පිරියත හා උපකරණ පිළිබඳ සම්පූර්ණ පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතුය. එසේ වුවද, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද යන්ත්‍රෝපකරණ හා මෝටර් වාහන 86 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රත්‍යාගණනය කර තිබුණි. තවද, එම වත්කම් පිළිබඳ ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සඳහා ස්වාධීන තක්සේරුකරුවකු සම්බන්ධ වී නොතිබුණි.

2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම්වලින් උද්ගත නොවූ ව්‍යාපෘති 04 කට අදාළ රු. 5,522,844 ක පාඩුවක් හා වෙනත් ව්‍යාපෘති 04 කට අදාළ රු. 18,886,039 ක ලාභයක් අතීතානුයෝගීව ගිණුම්ගත කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ලාභයට ගලපා තිබුණි.

(ආ) අතීතානුයෝගීව ගැලපීමෙන් තොරව පෙර වර්ෂ දෝෂ නිවැරදි කිරීමේ අරමුණින්, රු. 394,934 ක මුදලක් ක්ෂය සඳහා බැර කර තිබූ අතර, රු. 889,623 ක් සහ රු.

1,040,750 ක් පිළිවෙලින් පොලී ආදායමට හා සමාලෝචිත වර්ෂයේ කෙරිගෙන යන ව්‍යාපෘතිවල ආදායමට හර කර තිබුණි.

(ඇ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය රු. 1,483,744,618 ක් විය. කෙසේවුවද, විලම්බිත බදු බැරකම ගණනය කිරීම සඳහා රු. 1,475,722,733 ක මුදලක් දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය ලෙස ගෙන තිබුණි. එබැවින් වර්ෂය සඳහා ආදායම් බදු වියදම හා විලම්බිත බදු බැරකම පිළිවෙලින් රු. 962,626 කින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) යන්ත්‍රෝපකරණ හා උපකරණ අලුත්වැඩියා හා නඩත්තු සඳහා දරන ලද රු. 413,537 ක වියදමක් 2011 වර්ෂයේ දී ඉන්ධන තැන්පතු ගිණුමට සාවද්‍යව හර කර තිබුණි. කෙසේවුවද, ගිණුම් ගැලපීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව (ESC) සහ ඒ මත අධිභාර එකතුව රු. 7,588,898 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එබැවින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ශේෂය සහ ගෙවිය යුතු අධිභාරය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 හා 2015 වර්ෂ තුළ දී ලැබුණු තක්සේරු දැන්වීම් අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට එකතු කළ අගය මත බදු (VAT) සඳහා අධිභාර ලෙස රු. 103,142,189 ක මුදලක් ගෙවිය යුතුව තිබුණි. කෙසේවුවද, මූල්‍ය ප්‍රකාශනවල එකතු කළ අගය මත බදු සඳහා අධිභාර ලෙස රු. 22,794,701 ක මුදලක් පමණක් ප්‍රතිපාදනය කර තිබුණි. තවද රු. 570,828 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) මත අධිභාරය සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3. නොසැසඳු වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අදාළ උපලේඛනයන්හි අනුරූපී ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 400,102,193 ක් වූ වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	උපලේඛන අනුව ශේෂය	වෙනස
	රු.	රු.	රු.
කෙරීගෙන යන ව්‍යාපෘති මත ලාභය	480,533,750	492,279,452	11,745,702
ගනුදෙනුකරුගෙන් ලැබිය යුතු මුදල්	1,134,453,828	1,328,932,384	194,478,556
ගනුදෙනුකරුට ගෙවිය යුතු මුදල්	-	189,188,280	189,188,280
ස්ථාවර වත්කම් අපහරණයේදී ලාභය	766,008	576,794	189,214
සෙමින් චලනය වන හා චලනය නොවන තොග සඳහා ප්‍රතිපාදනය	9,564,564	9,663,455	98,891
ටෙන්ඩර් තැන්පතු (ආපසු ගෙවියයුතු)	199,875	100,000	99,875
ආපසු ගෙවිය යුතු තැන්පතු	371,909	484,799	112,890
එකතු කළ අගය මත බදු	561,051,351	556,862,566	4,188,785
			-
එකතුව	2,186,941,285	2,578,087,730	400,102,193

2.2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම

රු. 173,495,156 ක් වටිනා එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති පහත සඳහන් සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

	ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
		රු.	
(i)	ණයගැතියන් - මාර්ග සංඥා පද්ධතිය	9,058,685	උපලේඛන හා කාල විශ්ලේෂණ
(ii)	පූර්ව ගෙවීම්	58,530	උපලේඛන හා කාල විශ්ලේෂණ
(iii)	ණය සහ අත්තිකාරම්	1,829,736	උපලේඛන හා කාල විශ්ලේෂණ

(iv)	අත්තිකාරම්		
	* මිලදී ගැනුම් අත්තිකාරම්	326,520	උපලේඛන හා කාල විශ්ලේෂණ
	* විවිධ අත්තිකාරම්	6,651,193	උපලේඛන හා කාල විශ්ලේෂණ
(v)	පිරියන හා යන්ත්‍රෝපකරණ සහ මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණිත වටිනාකම	116,936,543	සහතික කරන ලද ප්‍රත්‍යාගණිත වාර්තාව
(vi)	රඳවා ගැනීම් බදු	38,633,949	රඳවා ගැනීම් බදු සහතිකවල පිටපත්

	එකතුව	173,495,156	
		=========	

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් අංශයට අදාළ වෙළඳ ණයගැති ශේෂයෙන් රු. 12,121,011 ක් වර්ෂ 07 කට අධික කාලයක් වූ කුකුළේගහ ව්‍යාපෘතියේ හිඟ ණයගැතියන්ගෙන් නියෝජනය වූ අතර රු. 13,537,401 ක මුදලක් වර්ෂ 03 කට වැඩි කාලයක් වූ ණයගැතියන්ගෙන් (කුකුළේගහ ව්‍යාපෘතිය හා මාර්ග සංඥා පද්ධතියේ ණයගැතියන් හැර) නියෝජනය විය. මෙම ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) අදාළ ගනුදෙනුකරුවන් සඳහා බිල්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් මාර්ග සංඥා පද්ධති ඒකකයේ සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එබැවින් මාර්ග සංඥා පද්ධතියේ රු. 65,699,518 ක ණයගැති ශේෂයෙන් සහතික නොකරන ලද බිල්පත් වටිනාකම රු. 46,735,259 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති 19 කින් ව්‍යාපෘති 17 ක බිල්පත් සමාලෝචිත වර්ෂයට පසු අදාළ සේවාදායකයන්ට යවා තිබුණි. ඉහත ණයගැති ශේෂයෙන් රු.9,058,685 ක මුදලක් වර්ෂ 07 කට වැඩි කාලයක් සඳහා හිඟ හිට පැවතුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 27,342,601 ක් වූ කොන්ත්‍රාත් අංගණ ණයගැතියන් 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඈ) සංස්ථාවේ ගොඩනැගිල්ලක් 2015 පෙබරවාරි 01 සිට 2017 ජනවාරි 31 දක්වා වර්ෂ 02 ක කාල පරිච්ඡේදයක් සඳහා පුද්ගලික සමාගමකට රු. මිලියන 1.2 ක මාසික කුලියකට ලබා දී තිබුණි. කුලී ගිවිසුමේ විධිවිධාන අනුව, සෑම මාසයකම 10 වන දිනට හෝ ඊට පෙර කුලිය ගෙවිය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමෙන් ලැබිය යුතු රු. 8,888,880 ක කුලිය අයකර ගැනීමට සංස්ථාවට ඇපොහොසත් වී තිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාලය විසින් දෙන ලද රු. 579,739 ක ගැනුම් අත්තිකාරම් වලින්, රු. 305,608 ක මුදලක් වර්ෂ 06 කට වඩා පැරණි විය. දෙන ලද අත්තිකාරම පිළිබඳ තොරතුරු නොමැති බැවින්, මෙම අත්තිකාරම් අයකර ගැනීම සැක සහිතය.

(ඊ) සේවා දායකයන්ගෙන් ලැබුණු රු. 385,069,709 ක වැඩ පූර්ව අත්තිකාරම් වලින් රු. 36,334,186 ක මුදලක් නිරවුල් කිරීමෙන් තොරව 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 කට වැඩි කාලයක් පැවතුණි. ඉන් රු. 14,648,421 ක මුදලක් නිරවුල් කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂ 05 කට වැඩි කාලයක් ගිණුම්වල පැවතුණි.

(උ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගෙවිය යුතු ඉදිකිරීම් රඳවා ගැනීම් මුදල් රු. 535,993,321 කින් රු. 240,316,537 ක මුදලක් වර්ෂ 3කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. ඉන් රු. 93,467,064 ක් නිමකරන ලද ව්‍යාපෘති 35 කට අදාළව වර්ෂ 05කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඌ) එකතු කළ අගය මත බදු (VAT) ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 561,051,351 ක මුදලක් ඒ සඳහා වූ රු. 22,794,701 ක දඩ මුදලක්ද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව විසින් ගෙවිය යුතු විය. ඒවා නිරවුල් කිරීමට හෝ අත්හැරීමට ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය	කෙටුම්පත් අයවැය ලේඛනය සඳහා ඊළඟ මුදල් වර්ෂයට මාස 03කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය සඳහා අනුමැතිය සමාලෝචිත වර්ෂය අවසන් වී මාස 10 කට පසු 2015 ඔක්තෝබර් 06 දින ලබාගෙන තිබුණි.
(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114(1) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය	සේවක වැටුප් වලින් අඩුකර ගැනීමෙන් තොරව සංස්ථාව විසින් එහි සේවකයන් සඳහා ගෙවන ලද වැටුප් ගෙවීම් වෙනුවෙන් උපයන විට ගෙවීම් බදු ලෙස (PAYE) රු. 1,766,606 ක මුදලක් ගෙවා නිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.8 වගන්තිය	මූල්‍ය බලතල පැවරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු අතර, එහි වියදම් සීමා දැක්විය යුතුය. එම මූල්‍ය බලතල පැවරීම් සීමාවන්ට බාහිරව කිසිදු වියදමක් සඳහා බලය දීම, දැරීම හෝ ගෙවීම සිදු නොකළ යුතුය. තවද, එම බලතල පැවරීම් එක් එක් වර්ෂය ආරම්භයේදී යාවත්කාලීන කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. කෙසේ වුවද සංස්ථාව විසින් මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොනිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 395	බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී දින 24 සිට දින 246 ක කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 50,339,247 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.112,449,561 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. 62,110,314 ක දැඩි පිරිහීමක් දැක්වුණි. මෙම තත්ත්වය සඳහා සේවක ප්‍රතිලාභ වියදම් වැඩිවීම, එකතු කළ අගය මත බදු සඳහා අධිභාර, අලුත්වැඩියා හා නඩත්තු වියදම් සහ හානිකරණය සඳහා ප්‍රතිපාදන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.1.1 සංස්ථාවේ අගය එකතු කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා බදු පූර්ව ශුද්ධ ලාභය රු.මිලියන 50.34 ක් වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ රට වෙනුවෙන් දායකය රු. මිලියන 950.46 ක් විය. තවද විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සංස්ථාවේ අගය එකතු කිරීම 2013 වර්ෂයේ දී හැර ක්‍රමයෙන් වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සංස්ථාවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

අනුපාත	වර්ෂය	
	2014	2015
	ප්‍රතිශතය	ප්‍රතිශතය
දළ ලාභ ආන්තිකය	9.7	6.7
දළ ලාභය (අධිකය)	10.7	7.2
පිරිවැටුම මත පරිපාලන පිරිවැය	8.3	5.2
පිරිවැටුම මත මූල්‍ය පිරිවැය	3.6	2.7
ජංගම අනුපාතය	1.04	1.02
ක්ෂණික අනුපාතය	0.9	0.9

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී, ඇස්පල්ට් පිරියත ඇතුළත්ව කොන්ක්‍රීට් අංගණ සහ මාර්ග සංඥා පද්ධති (TLS) ඒකකවල මෙහෙයුම් ලාභය සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් සියයට 139 කින් සහ සියයට 101 කින් පිරිහී තිබුණි.

(ii) මාර්ග සංඥා පද්ධති ඒකකය හා ඇස්පල්ට් පිරියත් දෙක මඟින් පිළිවෙලින් රු. 228,827,260 ක හා රු. 108,496,320 ක දළ පාඩුවක් වාර්තා කර තිබුණි. සංස්ථාවේ ඇස්පල්ට් පිරියත ඇතුළත් මාර්ග සංඥා පද්ධති ඒකකය අබණ්ඩව පාඩු මත පවත්වා ගෙන ගොස් තිබූ අතර කොන්ක්‍රීට් අංගණය පළමු වරට සමාලෝචිත වර්ෂයේ රු. 15,608,406 ක දළ පාඩුවක් වාර්තා කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2012 සිට 2014 කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ දක්වා ඇති පහත සඳහන් අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු පියවරක් හෝ උපාය මාර්ගයක් ගෙන හෝ හඳුනාගෙන නොතිබුණි.

(අ) විමර්ශනය, ආයෝජනය, සැලසුම් කිරීම, නිර්මාණයන්, ඉදිකිරීම් මෙහෙයුම් හා ගොඩනැගිලි කළමනාකරණය, සිවිල් ඉංජිනේරු, වෙනත් ඉංජිනේරු ව්‍යාපෘති හෝ

ශ්‍රී ලංකාවේ හෝ විදේශයක වෙනත් ව්‍යාපාර, යම්කිසි පාර්ශවයකට අයත් ස්වාධීනව හෝ දේශීයව හෝ විදේශීයව යම්කිසි සමාගමක් සමඟ සාමූහිකව, එවැනි සමාගම්වල කොටස් අත්පත්කරගැනීම සහ පවත්වා ගැනීම.

(ආ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ඉහත ව්‍යාපෘති වලින් ඕනෑම එකක් හෝ ක්‍රියාත්මක කරවීම හෝ අධීක්ෂණය : ස්වාධීනව හෝ දේශීය හෝ විදේශීය ආයතනයක් හෝ සමාගමක් සමඟ සාමූහිකව සහ එම සමාගමේ කොටස් අත්පත්කර ගැනීම සහ පවත්වා ගැනීම.

(ඇ) හඳුනාගන්නා ලද කාර්යයන් සඳහා භාවිතා කරන ඉදිකිරීම් ද්‍රව්‍ය ක්‍රම හා ශිල්පීය ක්‍රම සඳහා පර්යේෂණ සිදු කිරීම.

(ඈ) සියයට 30 ක තිරසාර පිරිවැටුම් වර්ධනයක් සපුරා ගැනීම.

4.2 මූල්‍ය කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2013 ජූලි 01 දිනැති අංක පීඊඩී/සීඕපී/15(56)/ජීඑන්/විඕඑල්-1 දරන ලිපිය අනුව, අනුමත අයිරා පහසුකම රු. මිලියන 580 ක් විය. විධිමත් ණය අයකරගැනීමේ යාන්ත්‍රණයක් හා කාරක ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ඉහත අයිරා පහසුකම ඉක්මවා රු. මිලියන 664.7 දක්වා අයිරා පහසුකමක් සංස්ථාව විසින් ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 75.4 ක් වූ පොලි මුදලක් මෙම බැංකු අයිරා සඳහා අදාළව ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 664.7 ක බැංකු අයිරාවක් තිබියදීත්, එකතුව රු. මිලියන 63 ක් වූ ස්ථාවර තැන්පතු, ඉනිරි කිරීම් තැන්පතු ද පවත්වා ගෙන ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 3 ක මුදලක් පමණක් එම ආයෝජන වලින් උපයාගෙන තිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමිනිරිගල ස්ථානගත කර ඇති ඇස්පල්ට් යන්ත්‍රවලින් එක් යන්ත්‍රයක සාමාන්‍ය නිෂ්පාදනය දිනකට මෙට්රික් ටොන් 100 ක් ලෙස පවත්වා ගෙන ගොස් තිබූ අතර එය එහි ධාරිතාවයෙන් සියයට 17 ක් විය. එබැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව එහි පිරිවැටුම හා දළ ලාභය පිළිවෙලින් සියයට 57 කින් හා සියයට 116 කින් අඩු වී තිබුණි. කෙසේවුවද එහි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා කළමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) බද්ධ ව්‍යාපාර ආයතනයක් වූ ෆුජීමා ස්ටෝට් කෝපරේෂන් (පිවිටී) ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 මාර්තු 31 දිනට සංස්ථාවට ලැබිය යුතු මුදල රු.41,899,490 ක් වූ අතර ඉන්පසු කිසිදු ගනුදෙනුවක් සිදු වී නොතිබුණි. කෙසේ වුවද ලැබිය යුතු මුදල අයකර ගැනීම සඳහා සංස්ථාවේ කළමනාකරණය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

4.4 අවිධිමත් ගනුදෙනු

2013 වර්ෂය තුළ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කළ අගය මත බදු ලියාපදිංචිය අක්‍රීය කරන ලද කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට එකතු කළ අගය මත බදු (VAT) රු.15,111,029 ක් ගෙවා තිබුණි.

4.5 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු ඇස්පල්ට් යන්ත්‍ර අතුරින් රු. මිලියන 125 ක් වටිනා ඇස්පල්ට් යන්ත්‍රයක් පොලොන්නරුවේ ස්ථානගත කර තිබුණි. එම යන්ත්‍රයෙහි නිෂ්පාදන ධාරිතාවය දිනකට ඇස්පල්ට් මෙට්රික් ටොන් 600 ක් විය. කෙසේ වුවද, 2014 වර්ෂයෙන් පසු එහි නිෂ්පාදන අත්හිටුවීම හේතුවෙන් එම යන්ත්‍රය හා උපාංග ඌන උපයෝජිතව පැවතුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ වේතන හා ආරක්ෂක වියදම් ලෙස රු. 876,790 ක මුදලක් සංස්ථාව විසින් වැය කර තිබුණි.

(ආ) කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව 2014 අගෝස්තු මාසයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 113,496 ක මුදලක් බැංකු ගිණුමක පැවතුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදල් මත අධිභාර ලෙස පිළිවෙලින් රු. 9,834,605 ක් හා රු. 17,265,163 ක මුදලක් සංස්ථාවට ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) නියමිත වේලාවට කොන්ක්‍රීට් නිෂ්පාදන සපයා නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා රු. 10,103,235 ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස සංස්ථාවට ගෙවීමට සිදු වී තිබූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 60 ක වැඩිවීමක් විය.

(ඇ) ව්‍යාපෘති 09 ක කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා කොන්ත්‍රාත් පිරිවැය දරා තිබූ හෙයින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.121,010,326 ක සමුච්චිත පාඩුවක් දරා තිබුණි. ඉහත ව්‍යාපෘතිවලින්, රු. 44,634,062 ක සමුච්චිත පාඩුවක් දරන ලද ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂය අවසානයට නිම කර තිබුණි.

4.7 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් අංශයට අදාළව ඉන්වොයිසි පිළියෙල කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන්, පිරිවැයට වඩා ඉතා ඉහළ හා පිරිවැයට වඩා ඉතා පහළ අගයන්ට ඉන්වොයිසි ඉදිරිපත් කර තිබූ අවස්ථා පැවතුණු අතර සැලකිය යුතු පිරිවැයක් දරා තිබුණද ඉන්වොයිසි නිකුත් කර නොතිබුණු අවස්ථාද විය. ජංගම වත්කම්වල හා ජංගම බැරකම් වල ඇතුළත් ගනුදෙනුකරුගෙන් ලැබිය යුතු හා ගනුදෙනුකරුට ගෙවිය යුතු වටිනාකම් අසාමාන්‍යව වැඩියෙන් ගණනය කිරීම් හා අඩුවෙන් ගණනය කිරීම් වැඩි වීම සඳහා මෙම තත්ත්වය බලපා තිබුණි.

උදාහරණයක් වශයෙන් - :

ඉදිකිරීම් අංශය විසින් ව්‍යාපෘති 06 ක් මත ඉන්වොයිසි නිකුත් කිරීමෙන් තොරව රු. 57,353,841 ක සමුච්චිත වියදමක් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද කෙරීගෙන යන ව්‍යාපෘති වලින්, ව්‍යාපෘති 44 කින් රු. 223,581,451 ක් වූ පාඩුවක් දරා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් එකතු වටිනාකම රු. 103,629,346 ක් වූ කෙරීගෙන යන ව්‍යාපෘති 6 ක් 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මකව නොතිබුණි.

4.8 වෙනත් ආයතනවලට මානව සම්පත් මුදා හැරීම

2003 ජූනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ සේවකයන් 2 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඔවුන් වෙනුවෙන් වැටුප්, වේතන හා දීමනා ලෙස රු. 985,861 ක මුදලක් සංස්ථාව විසින් දරා තිබුණි.

4.9 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 475 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 548 ක් විය. ඒ අනුව සේවකයන් 73 ක අතිරික්තයක් විය.

(ආ) ඉහළ කළමනාකරණයේ නිලධාරීන් ඇතුලුව කොන්ත්‍රාත් පදනම මත සේවකයන් වරින් වර බඳවා ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය නියෝජනය වන තනතුරු 02 ක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි. එබැවින් එය සංස්ථාවේ කාර්ය සාධනයට සෘජුවම බලපා තිබුණි. පෙර වර්ෂ තුළ දී මෙම තනතුරු සඳහා සේවක පිරිවැටුම ඉතා ඉහළ අනුපාතයක විය.

(ඇ) 2006 අගෝස්තු 01 දිනැති අංක 28(ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සහ ආයතන සංග්‍රහයේ 11 කාණ්ඩයේ 1.2 ඡේදයේ දක්වා ඇති විධිවිධාන අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව තනතුරු ඇති කිරීම හා පුරප්පාඩු පිරවීම සිදු නොකළ යුතුය. එසේ වුවද අනුමත නොවූ තනතුරු 11 ක් ඇතුළත් තනතුරු 20 ක් ඇති කර එම තනතුරු සඳහා සේවකයන් 108 ක් බඳවා ගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට උප කොන්ත්‍රාත් ශ්‍රමිකයන් 811 ක් යොදවා ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ඔවුන්ගේ වැටුප් හා දීමනා සඳහා රු. 216,460,758 ක මුදලක් දරා තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන දින 186 ක ප්‍රමාදයක් සහිතව 2016 සැප්තැම්බර් 02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2014 පෙබරවාරි 12 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/01/04/2014/01 දරන චක්‍රලේඛය අනුව, 2015 සිට 2017 වර්ෂයෙන් ආවරණය වන කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) තවද ඉහත චක්‍රලේඛයේ විධිවිධාන අනුව, එම සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන ඊළඟ මූල්‍ය වර්ෂය සඳහා ක්‍රියාත්මක කළ යුතු වාණිජමය කාර්යයන් අන්තර්ගත කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේවුවද කරුණු එසේ තිබියදී, අයවැය ලේඛනය, ඇස්තමේන්තු හා අයවැයගත ප්‍රාග්ධන වියදම ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, මාස 10 ක් ඉකුත් වීමෙන් පසුව 2015 ඔක්තෝබර් 06 දින එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. එම ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව පහත සඳහන් දුර්වලතාද නිරීක්ෂණය විය.

(i) මානව සම්පත් සංවර්ධන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්මක් නොතිබීම.

(ii) මූල්‍ය වර්ෂය සඳහා ක්‍රියාත්මක කළ යුතු වාණිජමය කාර්යයන් ඇතුළත් කිරීමෙන් තොරව එක් එක් අංශය සඳහා මූල්‍ය ඉලක්කයන් පමණක් සඳහන් කර තිබීම.

(iii) ඉලක්කයන් ඉටු කර ගැනීම සඳහා සම්පත් අවශ්‍යතාවය දක්වා නොතිබීම.

5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම් අතර සියයට 19 සිට සියයට 61 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද එය රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2016 පෙබරවාරි 16 දින දීය.

(ආ) ප්‍රාග්ධන විෂයයන් වෙනුවට සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගත යුතු අමු ද්‍රව්‍ය විෂයයන් සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

පාලන ක්ෂේත්‍රය	නිරීක්ෂණය
(අ) ගිණුම්කරණය	(i) පෙර වර්ෂ ගිණුම්කරණ දෝෂ සියල්ලම අතීතානුයෝගීව ගැලපීම් කිරීමෙන් තොරව ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර තිබුණි.
	(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම.
	(iii) ගෙවිය යුතු බදු හා ඒ සඳහා අධිභාර ගිණුම්ගත කර නොතිබුණි.

		(iv)	පාලන ගිණුම් සසඳා නොතිබීම.
		(v)	නියමිත දිනයන්ට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම.
(ආ)	වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්	(i)	ණය ගැනියන් පිළිබඳ දුර්වල පාලනයක් නිරීක්ෂණය විය.
		(ii)	රජයේ ණය ක්‍රම ක්‍රමයෙන් වැඩි වී තිබුණි.
		(iii)	හිඟ දිගුකාලීන ණයගැතියන් නිරීක්ෂණය විය.
		(iv)	ඉන්වොයිස් කිරීම හා අදාළ සේවා දායකයන් සඳහා ඉදිරිපත් කිරීම පිළිබඳ සැලකිය යුතු ප්‍රමාදයන්
		(v)	හිඟ දිගුකාලීන ගැනුම් අත්තිකාරම්
		(vi)	හිඟ දිගුකාලීන ඉදිකිරීම් රඳවා ගැනීම් මුදල්
(ඇ)	වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	(i)	හිඟ දිගුකාලීන වැඩ පූර්ව අත්තිකාරම්
		(ii)	හිඟ දිගුකාලීන ඵදු හා ඒ සඳහා අධිභාර උදාහරණ - : එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බදු
(ඈ)	කාර්ය මණ්ඩල කළමනාකරණය	(i)	මානව සම්පත් වෙනත් ආයතනවලට මුදා හැරීම.
		(ii)	අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයන් බඳවා ගැනීම
		(iii)	කොන්ත්‍රාත් පදනම මත ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සඳහා නිලධාරීන් බඳවා ගැනීම
(ඉ)	වත්කම් කළමනාකරණය	(i)	2014 වර්ෂයේ සිට පොලොන්නරුවේ පැවති නිෂ්කාර්ය ඇස්පල්ට් යන්ත්‍රය
		(ii)	ස්ථාවර වත්කම්වල ශුද්ධ පොත් අගය සමාලෝචනය නොකිරීම හා වාර්ෂිකව යළි දක්වා නොතිබීම.

(iii) වර්ෂය අවසානයේදී සියලු ඉඩම්වල අයිතිය අත්කර ගැනීමට නොහැකි වීම.

(ඊ) ඉන්වෙන්ට්‍රි පාලන පද්ධතිය

(i) එක් එක් හා සියලුම වැඩබිම්වල භෞතික තොග ශේෂය හා ලෙජරයේ තොග ශේෂය සැසඳීම් සිදු නොකිරීම.

(ii) විශේෂයෙන් යන්ත්‍රෝපකරණ හා මෝටර් වාහනවල අමතර කොටස් සඳහා විධිමත් මිල කැඳවීම් පද්ධතියක් අනුගමනය නොකිරීම.

අ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)

	සටහන	2015	2014
ආදායම්	01	2,429,513,031	3,466,394,952
විකුණුම් පිරිවැය	02	(2,193,414,947)	(3,234,011,015)
දළ ලාභය/(අලාභය)		**236,098,085**	**232,383,938**
වෙනත් ආදායම්	03	176,631,024	171,015,809
මෙහෙයුම් වියදම් වලට පෙර ලාභය/අලාභය		**412,729,108**	**403,399,747**
පරිපාලන වියදම්	04	(201,089,843)	(180,308,429)
බෙදාහැරීම පිරිවැය	05	-	-
වෙනත් වියදම්	06	(77,026,709)	(22,928,839)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල		**134,612,557**	**200,162,479**
මූල්‍ය ආදායම	07	2,920,398	5,637,343
මූල්‍ය වියදම	07	(87,193,708)	(93,350,261)
බදු පෙර ලාභය		**50,339,247**	**112,449,561**
බදු වියදම්	08	12,708,574	(3,989,060)
අඛණ්ඩ මෙහෙයුම් වලින් ලාභය		**63,047,821**	**108,460,502**
නතර කළ මෙහෙයුම් තුලින් ශුද්ධ ලාභ/(අලාභ)		-	-
වර්ෂය සඳහා ලාභය		**63,047,821**	**108,460,502**
වෙනත් විස්තර කරන ලද ආදයම්			
අර්ථ දක්වන ලද ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභය (අලාභය)	19.01	(14,177,364)	(3,141,881)
වෙනත් විස්තර කරන ලද ආදයම් මත බදු		(1,701,284)	1,377,578
බදු අඩු කළ පසු වෙනත් විස්තර කරන ලද ආදයම්		**(15,878,648)**	**(1,764,303)**
විස්තර කරන ලද මුළු ආදායම		**47,169,173**	**106,696,198**

පිටු අංක 51 සිට 86 දක්වා මූල්‍ය ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය කොටසක් ලෙස සැලකිය යුතුය.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
දෙසැම්බර් 31 වන දිනට

(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)	සටහන	2015	2014
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල,පිරියත හා උපකරණ	09	1,483,744,618	1,749,183,688
රජයේ සතු සමාගම් වල ආයෝජන කිරීම	10	9,210,740	9,210,740
ව්‍යුත්පන්නයන් හා වෙනත් ආයෝජන	11	53,753,158	52,361,138
විලම්බිත වත්කම් බදු	12	104,883,976	109,882,325
මුළු ජංගම නොවන වත්කම්		**1,651,592,492**	**1,920,637,891**
ජංගම වත්කම්			
හාණ්ඩ තොග	13	271,485,946	305,222,958
අනේකුත් ආයෝජන ඇතුළු වෙනත් ව්‍යුත්පන්නයන්	10	9,231,363	27,851,255
ආදායම් බදු වත්කම්	14	87,207,174	78,007,326
වෙළඳ සහ වෙනත් ලැබීම්	15	2,045,126,938	2,132,216,097
මුදල් හා ඒ සමාන දෑ	16	158,980,858	12,586,112
මුළු ජංගම වත්කම්		**2,572,032,279**	**2,555,883,748**
මුළු වත්කම්		**4,223,624,771**	**4,476,521,639**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රාග්ධන		16,671,651	16,671,651
ප්‍රාග්ධන ප්‍රදාන		51,140,000	51,140,000
ප්‍රාග්ධන සංචිත		6,629,760	6,629,760
රජයේ ප්‍රදානය		684,960,714	931,436,542
ප්‍රත්‍යාගණන සංචිත		763,088,808	763,088,808
රදවාගත් ලාභය		34,748,343	(12,420,830)
මුළු හිමිකම්		**1,557,239,276**	**1,756,545,931**
ජංගම නොවන වගකීම්			
ණය හා ණය ගැනීම්	18	35,050,000	41,145,819
විශ්‍රාමික ප්‍රතිලාභ	19	69,022,908	60,392,503
විලම්බිත බදු වගකීම්	12	94,138,628	121,350,263
ගෙවිය යුතු වෙළඳ හා අනෙකුත් වගකීම්	20	-	-
මුළු ජංගම නොවන වත්කම්		**198,211,536**	**222,888,586**
ජංගම වත්කම්			
ගෙවිය යුතු වෙළඳ හා අනෙකුත් වගකීම්	20	1,793,287,634	1,854,327,741
ණය හා ණය ගැනීම්	18	8,459,720	14,877,204
කල්බදු ණය හිමියන්	17	396,602	6,543,256
බැංකු අයිරා	21	666,030,002	621,338,921
මුළු ජංගම වගකීම්		**2,468,173,958**	**2,497,087,122**
මුළු හිමිකම් හා වගකීම්		**4,223,624,771**	**4,476,521,639**

ප්‍රධාන මූල්‍ය නිලධාරි

2016-07-28 වන දින

මූල්‍ය ප්‍රකාශන සැකසීම් හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට අත්සන් කරන ලදි.

සභාපති **අධ්‍යක්ෂ** **සාමාන්‍යාධිකාරී**

2016-07-28 වන දින **2016-07-28 වන දින** **2016-07-28 වන දින**

පිටු අංක 51 සිට 86 දක්වා මූල්‍ය ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය කොටසක් ලෙස සැලකිය යුතුය.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
හිමිකම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)

විස්තරය	ප්‍රාග්ධන	ප්‍රාග්ධන ප්‍රධානයන්	ප්‍රාග්ධන සංචිත	නැවත ඇගයීම් රක්ෂණය	රජයේ ප්‍රධානයන්	රඳවාගත් ලාභ ලාභය	මුළු හිමිකම්
2014-01-01 දිනට ශේෂය	16,671,651	51,140,000	6,629,760	763,088,808	1,074,333,747	(119,117,028)	1,792,746,938
ගැලපීම්	-		-	-	-	-	-
වර්ෂය සඳහා ලාභය	-		-	-	-	103,574,712	103,574,712
රජයේ ප්‍රදානය	-				(142,897,205)		(142,897,205)
මුළු වෙනත් විස්තරාත්මක ආදායම්	-		-	-	-	(3,141,881)	(3,141,881)
2014-12-31 දිනට ශේෂය	16,671,651	51,140,000	6,629,760	763,088,808	931,436,542	(18,684,197)	1,750,282,564
පෙර වර්ෂය සඳහා ගැලපුම්						6,263,367	6,263,367
2014-12-31 දිනට ශේෂය (සංශෝධිත)	**16,671,651**	**51,140,000**	**6,629,760**	**763,088,808**	**931,436,542**	**(12,420,830)**	**1,756,545,931**
ගැලපීම්	-	-	-	-	(116,936,543)		(116,936,543)
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	63,047,821	63,047,821
රජයේ ප්‍රදානය					(129,539,286)	-	(129,539,286)
මුළු වෙනත් විස්තරාත්මක ආදායම්						(15,878,648)	(15,878,648)
2015-12-31 දිනට ශේෂය	**16,671,651**	**51,140,000**	**6,629,760**	**763,088,808**	**684,960,714**	**34,748,343**	**1,557,239,276**

පිටු අංක 51 සිට 86 දක්වා මූල්‍ය ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය කොටසක් ලෙස සැලකිය යුතුය.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා		**2015**	**2014**
(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)	**සටහන**		
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය			
බදු වලට පෙර ලාභය		50,339,247	112,449,561
ගැලපුම් සඳහා			
ක්ෂය වටිනාකම්		157,220,742	172,690,713
කාර්ය මණ්ඩල පෙර ගෙවුම් වියදම්		-	
නිශ්චිත කරන ලද සැලසුම් ප්‍රතිලාභ		7,240,891	8,081,024
දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීමේ (ලාභය) අලාභය		(766,008)	-
විදේශ මුදල් ණය මත (ලාභය) අලාභය			-
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් මත නානිකර පාඩු		76,675,190	22,230,204
අවිනිශ්චිත පොලිය		394,651	1,249,669
මූල්‍ය වියදම්		86,799,056	92,100,591
විලම්බිත ආදායම්		(129,539,286)	(142,897,205)
මන්දගාමී හා සංවරණය නොවන නොග සඳහා ප්‍රතිපාදන		3,717,915	1,678,988
මූල්‍යමය ආදායම්		(2,920,398)	(5,637,343)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය (අලාභය)		**249,162,001**	**261,946,204**
භාණ්ඩ නොග (වැඩිවීම) / අඩුවීම		30,019,097	3,658,295
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් (වැඩිවීම) අඩුවීම		25,414,552	219,104,313
මිලදි ගැනීම් සහ උප කොන්ත්‍රාත් අත්තිකාරම් (වැඩිවීම) අඩුවීම		(14,276,535)	66,762,787
ණය සහ අත්තිකාරම් (වැඩිවීම)/ අඩුවීම		(120,230,530)	(505,721,989)
වෙළඳ සහ වෙනත් ගෙවීම් වැඩිවීම/ (අඩුවීම)		49,726,923	(40,334,773)
මෙහෙයුම් වලින් මුදල් උත්පාදනය (භාවිතය)		**219,815,508**	**5,414,837**
මූල්‍ය පිරිවැය ගෙවුම්		(77,335,556)	(82,637,091)
පාරිතෝෂිකය ගෙවුම්		(12,787,850)	(7,270,935)
බදු ගෙවුම්		(20,405,843)	(3,371,957)
මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය (භාවිතය)		**109,286,259**	**(87,865,146)**
ආයෝජන කටයුතු මගින් මුදල් ප්‍රවාහය (භාවිතය)			
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්		(8,964,791)	(18,532,904)
දේපළ, පිරියත හා උපකරණ විකුණුම් ලැබීම්		1,012,584	-
ස්ථාවර තැන්පතු ආයෝජන		(1,826,397)	(2,809,526)
ලැබුණු මූල්‍යමය ආදායම්		3,612,931	5,431,629
ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය (භාවිතය)		**(6,165,673)**	**(15,910,801)**
මූල්‍යමය කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය (භාවිතය)			
ණය හා ණය ගැනුම් ආපසු ගෙවීම්		(12,513,304)	(45,804,680)
ණය ගැනීමෙන් ලැබෙන මුදල්		-	-
මූල්‍ය කල්බදු ආපසු ගෙවීම්		(6,541,305)	(8,829,343)
මූල්‍යමය කටුයතු මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (භාවිතය)		**(19,054,609)**	**(54,634,023)**
මුදල් සහ මුදල් වලට සමාන වූ දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**84,065,977**	(158,409,970)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වූ දෑ		(581,883,758)	(423,473,788)
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන වූ දෑ	16	**(497,817,781)**	**(581,883,758)**

පිටු අංක 51 සිට 86 දක්වා මූල්‍ය ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය කොටසක් ලෙස සැලකිය යුතුය.

1. සංස්ථාපිත තොරතුරු

1.1. පොදු

රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර පිහිටුවා ඇති ආයතනයකි. මෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය නො. 07 බොරුපන පාර, රත්මලාන යන ස්ථානයේ පිහිටුවා ඇත. ආයතනයේ ප්‍රධාන ඉදිකිරීම් කාර්යයන් ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය පැලියගොඩ සහ පේරාදෙණිය වෙත විමධ්‍යගතකර ඇත, රත්මලාන, බෝපිටිය, වේරගංතොට සහ මැදවච්චිය යන ස්ථානවල පෙරසවි කොන්ක්‍රීට් නිපදවන අංශය සහ අලෙවි මධ්‍යස්ථාන ස්ථාපනය කර ඇත.

1.2. තුලනාත්මක තොරතුරු

පසුගිය වර්ෂයේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මේ වර්ෂයේද යොදා ගෙන ඇත. මෙම වර්ෂයේදී ගිණුම් ඉදිරිපත් කිරීමේදී පසුගිය වර්ෂයේ සමහර සංඛ්‍යා සහ දත්තයන් සුදුසු පරිදි නැවත සංශෝධනය කර ඇත.

1.3. ප්‍රධාන ව්‍යාපාර කටයුතු

ඉදිකිරීම් කොන්ත්‍රාත්තු, ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පෙරසවි කොන්ක්‍රීට් නිපදවීම සහ අලෙවි කිරීම ඒ සඳහා කොන්ත්‍රාත්තු භාර ගැනීම සහ මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා විදුලි සංඥා සවි කිරීම සහ ඒවා අලෙවි කිරීම, නඩත්තු කිරීම ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වේ.

1.4. සේවක ප්‍රමාණය

වර්ෂය අවසාන වන විට ආයතනයේ සේවකයන්ගේ ප්‍රමාණය 552 ක් විය.

1.5. නිකුත් කිරීම සඳහා බලයලත් දිනය

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2016 ජූලි මස 28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය ලබා දෙන ලදී.

2. වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සංක්ෂිප්ත සටහන

2.1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1. සැකසීමේ පදනම

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍යමය තත්ත්වය, ආදායම් ලැබීමේ ක්‍රමවේදය විස්තර සහිතව, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, හිමිකම් වල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් සම්බන්ධ ප්‍රකාශන වලින් යුක්ත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අර්ථ නිරූපණ වලට අනුකූලව පිළියෙළ කරනු ලැබේ.

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුගත වීම තුලින් පසුගිය අවස්ථාවල වාර්තා කරන ලද ආයතනයේ මූල්‍යම තත්ත්වය, මූල්‍යමය ක්‍රියාකාරිත්වයන් සහ මුදල් සංසරණය පිළිබඳ ප්‍රකාශන වලට සිදුවූ බලපෑම පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ සටහන් ලෙස ඉදිරිපත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් අයුරකින් සඳහන් කර ඇති අවස්ථාවකදී හැර සියලුම වර්ෂවල මූල්‍ය වාර්තා සැකසීමේදී මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිතා කර ඇත.

2.1.2. විදේශ මුදල් පරිවර්තනය.

සියලුම විදේශ මුදල් ගනුදෙනු එම ගනුදෙනු සිදු වූ අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශීය මූල්‍යමය වටිනාකම් වලින් යුක්ත මූල්‍යමය වත්කම් සහ බැරකම් වර්ෂ අවසානයේදී පැවති විනිමය අනුපාතවලට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර ගණනය කරනු ලැබේ. මූල්‍යමය නොවන වත්කම් සහ බැරකම් වටිනාකම ගණනය කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත අනුව පරිවර්තනය කරනු ලැබේ. තිරවුල් නොකරන ලද මූල්‍යම වත්කම් සහ බැරකම් නැවත පරිවර්තනය කිරීමේදී විදේශ විනිමය ලාභ පාඩු ක්ෂණිකව හඳුනාගනු ලබන අතර, එසේ නොකරන්නේ විදේශ මෙහෙයුම් හි ශුද්ධ ආයෝජනවල ඉදිරි රැකුමන් ලෙස සුදුසුකම් ලබන විදේශ මුදලින් ණය ගැනිමකදීය. එවැනි අවස්ථාවකදී විනිමය වෙනස්වීම් අනෙකුත් විස්තර කරන ලද අදායමක් ලෙස හඳුනාගන්නා අතර, විදේශ විනිමය සංචිත වලට විදේශීය මෙහෙයුම් නැවත පරිවර්තනය කිරීමෙන් පැන නැගෙන විදේශ විනිමය වෙනස්කම් එකතු කරනු ලබයි.

2.1.3. සම්බන්ධිත පාර්ශව සමග සම්බන්ධතා

මෙම සංස්ථාව මාස්ට් ට්‍රස්ට් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සමග හවුල් ව්‍යාපාර ගිවිසුමකට එළඹ ඇති අතර, ෆුජිමා ස්ටේට් කෝපරේෂන් (පුද්ගලික) සමාගම සමග අනුබද්ධිත සමාගමක් ලෙස අතීතයේදී කටයුතු කරගෙන යන ලදී. ප්‍රායෝගික දුෂ්කරතා හේතු කොටගෙන ඒ සඳහා ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර නොමැති අතර, අනුබද්ධ සමාගමේ ආයෝජන පිරිවැයට පෙන්නුම්කර ඇත.

2.1.4. බදු තක්සේරු කිරීම

(අ) පවත්නා බදු

මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ආදායම් හා වියදම් මත පාදක වී ආදායම් බදු ගණනය කිරීම පනත් අංක. 10 දරණ දේශීය ආදායම් බදු පනත 2006 සහ එයට සිදුකර ඇති සංශෝධනයන්ට අනුකූලව සිදු කරයි..

(ආ) විලම්බිත බදු

විලම්බිත බදු වෙනස් කිරීම වගකිම් ක්‍රමය භාවිතා කරමින් සිදු කරයි. මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තාකරන වත්කම් සහ වගකිම් සහ බදු අරමුණු සඳහා යොදා ගනු ලබන වත්කම් හා වගකිම් අතර ඇති කෙටි කාලීන වෙනස්කම් සඳහා ප්‍රතිපාදන සිදු කරයි. වාර්තා කරන දිනට පවතින නීති මත පදනම් වී වගකිම් නිදහස් කරන විට තාවකාලික වෙනස්වීම් සඳහා යෙදා ගනු ලබන බදු අනුපාතය, විලම්බිත බදු ගණනය කිරීම සඳහා භාවිතා කරයි.

තාවකාලික වෙනස්කම් පියවා ගැනීමට ප්‍රමාණවත් තරම් අනාගත බදු අය කළ හැකි ලාභ ඉපයීමට සම්භාවිතාවන් ඇති විටදි ඊට සරිලන ප්‍රමාණයන් දන්වා විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ.

සංස්ථාවේ ඉදිකිරීම් කටයුතු හා අනෙකුත් කටයුතු සඳහා වෙනස් බදු අනුපාත අදාල වන බැවින් විලම්බිත බදු ගණනය කිරීමේදි වෙන වෙනම ගණනය සිදුකරනු ලබයි. පවත්නා බදු වත්කම් සහ පවත්නා බදු වගකිම් හිලව් කිරීමට නෛතික බලාත්මක කළහැකි හිමිකමක් ඇති විටදි සහ විලම්බිත බදු එකම බදු අයකළ හැකි ආයතනයකට සහ එකම බදු අධිකාරියකට සම්බන්ධ අවස්ථාවලදි විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකිම් හිලව් කළහැක.

2.1.5. ණය පිරිවැය

අපේක්ෂිත කාර්යය හෝ විකිණීම සඳහා සුදානම් කිරීමට සැලකිය යුතු කාල සීමාවන් ගනු ලබන වත්කම් අත්පත් කරගැනිමේදී, ඉදිකිරිමේදී හෝ නිප්පාදනය කිරිමේදී සෘජුව අදාල වන ණය පිරිවැය එම වත්කමේ වියදමේ කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරනු ලැබේ. අනෙකුත් සියලු ණය පිරිවැය අදාල කාලය තුළ සිදුවූ වියදම් ලෙස ගණන් ගැනෙනු ඇත. ණය ලබා ගැනිමේදි ගෙවීමට සිදුවන පොලී සහ අනෙකුත් ගෙවීම් ණය පිරිවැය ලෙස සලකනු ලැබේ.

2.2. වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

2.2.1. දේපළ පිරියත හා උපකරණ

පිරිවැය සහ වටිනාකම

සියලු දේපළ, පිරියත සහ උපකරණ මූලික වශයෙන් පිරිවැයට ගිණුම්ගත කරනු ලැබේ. යම් දේපලක්, පිරියතයක් හෝ උපකාරයක් අත්පත් කරගැනිමට හෝ ඉදිකිරිමට හා එහි අපේක්ෂිත භාවිතය අත්පත් කරගැනිමට අවශ්‍ය ක්‍රියාකල හැකි තත්ත්වය ලබාගැනිම සඳහා දැරිය යුතු වියදම අදාළ වත්කමේ පිරිවැය වේ. මූලික වටිනාකම් තක්සේරු කිරීමෙන් පසුව සිදුකරන නැවත තක්සේරු කිරීම් වලදි වැයවීම් අනුපාතය අනුව අගය අඩුකිරීම් සිදු කිරීම මගින් නැවත සැකසීම සිදු කෙරේ. දේපළ, පිරියත හෝ උපකරණ වලට අයත් ප්‍රධාන අයිතමයක් සඳහා වෙනස් භාවිතා කල හැකි කාලයක් ඇති අවස්ථා වලදී ඒවා වෙනස් අයිතමයන් ලෙස ගිණුම් ගත කිරීම සිදුකරනු ලැබේ.

පසු වියදම්

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ අලුත්වැඩියා කිරීම් ඇතුළු වෙනම ගිණුම්ගත කර තිබූ දේපල පිරියත සහ උපකරණ වල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දැරූ වියදම ප්‍රාග්ධනීගත කරනු ලැබේ. යම් පසු වියදම ඒ දේපල පිරියත සහ උපකරණ වල අන්තර්ගත අනාගත ආර්ථික වාසි වර්ධනය කරන්නේ නම් පමණක් එම පසු වියදම් ප්‍රාග්ධනීගත කරනු ලැබේ. දේපල පිරියත සහ උපකරණ මගින් ආරම්භයේදී ගණනය කරන ලද කාර්ය්‍ය සාධන මට්ටම තුලින් ලගාකර ගැනීමට අපේක්ෂා කරන ලද අනාගත ආර්ථික වාසි ප්‍රතිස්ථාපනය කිරීමට හෝ පවත්වාගෙන යාම සඳහා දරණ ලද අනෙකුත් සියළු වියදම් එම වියදම් දරන අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

ප්‍රත්‍යාගණනය

දේපල පිරියත සහ උපකරණ පසුකාලීනව ප්‍රත්‍යාගණනය කිරීමේදී, ප්‍රත්‍යාගණනය කරනු ලබන වත්කම් පන්තියට ඇතුලත් සියළුම වත්කම් සාධාරණ අගයන්ට ප්‍රත්‍යාගණනය කලයුතුය. ප්‍රමාණවත් කාල සීමාවන් අතරතුරදී ප්‍රත්‍යාගණනයන් සිදුකරනු ලබයි. යම්කිසි වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රත්‍යාගණන අතිරික්තයන් ඇත්නම් එය අනෙකුත් විස්තරාත්මක ආදායමක් ලෙස හඳුනා ගනු ලබන අතර, හිමිකම්හි ඇති වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලබයි. කෙසේ නමුත් එම වත්කම මීට පෙර ප්‍රත්‍යාගණනය හේතුවෙන් අගය අඩු වී ඇති විට සහ එය විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති අවස්ථාවලදී නැවත ප්‍රත්‍යාගණනය මගින් පෙර කී අගය අඩුවීම පියවා ගතහැකි අවස්ථාවලදී ප්‍රත්‍යාගණනය අතිරික්තය විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලබයි.

යම්කිසි වත්කමක් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන අලාභයන් ඇති වූ විට එම වත්කම් සම්බන්ධව පෙර වර්ෂ වල ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඇත්නම් එම අලාභය සාදුවම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති වටිනාකම දක්වා පියවා ඉතිරියක් ඇතිනම් වියදමක් ලෙස සලකනු ලබයි. ප්‍රත්‍යාගණන දිනට ඇති සමුච්චිත ක්ෂය වටිනාකම වත්කමේ දළ වටිනාකමින් ඉවත් කර ශුද්ධ වටිනාකම ප්‍රත්‍යාගණන වටිනාකමට සටහන් කරනු ලැබේ. වත්කම ඉවත් කිරීමේදී විකිණූ වත්කමට සම්බන්ධ ප්‍රත්‍යාගණන සංචිත රදවාගත් ඉපයීම් වලට මාරු කරනු ලබයි.

අපචය

දේපල පිරියත සහ උපකරණ වල වටිනාකම වාර්ෂිකව අපචය සඳහා සමාලෝචනය කිරීම හෝ වටිනාකම අයකරගත නොහැකි බවට සිද්ධි හෝ පවතින තත්ත්වයේ වෙනස්වීම් මගින් ඇගවෙන විට සිදුකරනු ලබයි. එවැනි ඇගවීම් ඇතිවිට එනම් වටිනාකම් ඇස්තමේන්තුගත අයකර ගතහැකි වටිනාකම ඉක්මවා යනවිට වත්කම් අයකරගත හැකි වටිනාකමට ලියාහරිනු ලබයි. මීට ඉහතදී කිසියම් වත්කමක් සඳහා ප්‍රත්‍යාගණනය අතිරික්තයක් නැති විටදී එම වත්කම සම්බන්ධයෙන් අපචය පාඩු ඇතිවිට එම පාඩු විස්තරාත්මක අදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

ක්ෂය වීම්.

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් දේපළ පිරියත සහ උපකරණ ඒවායෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගතහැකි ආයු කාලය පුරා වියදම මත හෝ ගණනය කල වටිනාකම මත සරල රේඛීය ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

වත්කමෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගතහැකි ආයු කාලයන් පහත පරිදි වේ.

වත්කම් වර්ගය	කාලය (වර්ෂ)
ඉඩම්	දිර්ඝ කාලීන
ගොඩනැගිලි	අවුරුදු 20
කාර්යාල උපකරණ	අවුරුදු 10
පිරියත සහ යන්ත්‍ර	අවුරුදු 10
මෝටර් රථ වාහන	අවුරුදු 05
වෙනත් වත්කම්	අවුරුදු 10

ක්ෂය අනුපාතයේ ප්‍රයෝජනයට ගතහැකි ආයු කාලය හෝ සුන්බුන් වටිනාකමේ සැලකිය යුතු වෙනසක් සිදුවී ඇතිබව පෙන්නුම් කරන්නේ නම් වත්කම් වල මුළු ජීවිත කාලයේ වටිනාකම සහ වත්කම්වල අවප්‍රමාණය විම නව සංශෝධන සඳහා යොදාගනු ලැබේ.

හදුනා ගැනිම නතර කිරිම.

දේපළ, පිරියත සහ උපකරණ වලට අයත් යම් වත්කමක් ඉවත් කිරිමේදි හෝ එම වත්කම් පාවිච්චි කිරිමෙන් හෝ ඉවත් කිරිමෙන් කිසිදු අනාගත ආර්ථික වාසියක් නොලැබෙන විටදි එම වත්කම හදුනාගැනිම නතර කරනු ලබයි. යම්කිසි වත්කමක් හදුනාගැනිම නතර කල විටදි පැන නැගෙන ලාභයන් හෝ අලාභයන් වෙනොත් එය සිදු වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

2.2.2. කල්බදු

